# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 79 දරන
# සිවිල් නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II. වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 3.90 යි. තැපැල් ගාස්තුව : රු. 2.30 යි

# 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 49/85.

**සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

**101 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 5 වන වගන්තියේ "තීන්දු ප්‍රකාශය" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "පිස්කල්වරයා" යන්නෙහි, නියෝජ්‍ය පිස්කල්වරයකු ඇතුළත් වේ;'.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

**"සාමාන්‍ය කාර්ය පටිපාටිය අනුව වූ නඩුවක් පැමිණිල්ලක් මගින් ආරම්භ කළ යුතු බව.**

39. සාමාන්‍ය කාර්ය පටිපාටිය අනුව වූ සෑම නඩුවක් ම, යථා පරිදි මුද්දර අලවන ලද ලිඛිත පැමිණිල්ලක් අධිකරණය වෙත හෝ ඒ කාර්යය සඳහා අධිකරණය විසින් පත් කරනු ලබන යම් නිලධරයකු වෙත හෝ ඉදිරිපත් කිරීමෙන් පවරනු ලැබිය යුතු ය. පළමුවන උපලේඛනයේ අංක 16 දරන ආකෘතිය අනුව විත්තිකරුවන්ගේ සංඛ්‍යාව අනුව වූ සිතාසි සංඛ්‍යාවක් සහ එකී උපලේඛනයේ අංක 17 දරන ආකෘතිය අනුව අණපත්‍රයක් පැමිණිල්ල සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දෙවන අතුරු වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (ඒ) ඡේදයෙහි "නොලැබූ කල්හි" යන වචන වෙනුවට "නොලැබූ කල්හි ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(බී) විත්තිකරුවන් සිටිනතාක් වූ සිතාසි සංඛ්‍යාවක් පැමිණිල්ල සමඟ ඉදිරිපත් කරනු නොලැබූ කල්හි;".

2—ඒ 103516—8,935 (88/05)

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබ 49 වන වගන්තියෙන් නියමිත පිටපත් හෝ සංක්ෂිප්ත ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබූ විට, අධිකරණයෙහි නඩුව පැවරීමේ දින සිට මාස තුනක් පසු නොවන සිතාසියෙහි නියම කරනු ලබන දිනයක හෝ ඊට පෙර පැමිණිල්ලට උත්තර බඳින ලෙස විත්තිකරුට නියම කරමින්, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරන ලද, පළමුවන උපලේඛනයේ අංක 16 දරන ආකෘතිය අනුව වූ සිතාසියක් නිකුත් කරන ලෙස අධිකරණය විසින් ආඥා කළ යුතු ය. විත්තිකරුගේ භාෂාව අධිකරණයේ භාෂාව නොවන විට විත්තිකරුගේ භාෂාවට පරිවර්තනය කරන ලද ඒ එක් එක් පිටපත හෝ සංක්ෂිප්ත ප්‍රකාශය හෝ ඒ සිතාසියට අමුණා එය එකී උපලේඛනයේ අංක 17 දරන ආකෘතිය අනුව වූ හෝ ඊට සමාන වූ හෝ අධිකරණයේ අණපත්‍රයක් යටතේ, විත්තිකරු පදිංචිව සිටින්නේ යම් අධිකරණයක හෝ ඒ හා සමාන අධිකරණ බලයක් ඇති අධිකරණයක හෝ අධිකරණ බලසීමා තුළ ද ඒ අධිකරණයේ පිස්කල්වරයා වෙත හෝ ඒ හා සමාන අධිකරණ බලයක් ඇති අධිකරණයක පිස්කල්වරයා වෙත හෝ භාර දිය යුතු ය. ඒ පිස්කල්වරයා විසින් ඒ සිතාසිය විත්තිකරු වෙත හෝ එක් විත්තිකරුවකුට වැඩි ගණනක් ඇත්තේ නම් ඒ එක් එක් විත්තිකරු වෙත හෝ යථා පරිදි භාර දෙනු ලැබීමට සැලැස්විය යුතු ය. තවද, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි භාරදීම ඇත්ත වශයෙන් පවරා ඇති නිලධරයා විසින් යථා පරිදි සහතික කරන ලද ඒ අණපත්‍රය සහ එය ක්‍රියාවේ යෙදවීම පිළිබඳ වාර්තාව ඒ පිස්කල්වරයා විසින් අධිකරණය වෙත ආපසු යැවිය යුතු ය :

එසේ වුව ද ඉහත සඳහන් පරිදි නම පාලනයෙන් බැහැර වූ හේතු නිසා විත්තිකරු වෙත සිතාසි භාරදීම අධිකරණයේ පිස්කල්වරයා පැහැර හරින අවස්ථාවක, අධිකරණය විසින් ස්වකීය අභිමතය අනුව, පැමිණිල්ලට උත්තර බැඳීමට විත්තිකරුට පළමුවෙන් නියම කරනු ලැබූ දින සිට මාස තුනක් පසු නොවන්නා වූ දිනයක් වන වෙනත් දිනයකට සිතාසි පිළිබඳව වාර්තා කිරීම සඳහා නියම කරන ලද කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ශ්‍රී ලංකාවෙන් පිටත සිතාසි භාරදීම සඳහා අවසරදීමේ ආඥාව.

70. ශ්‍රී ලංකාවෙන් පිටත සිතාසි භාර දීම ක්‍රියාත්මක කිරීමට අවසර දීමේ සෑම ආඥාවක් ම, ඒ සිතාසි භාර දීම ක්‍රියාත්මක කළ යුතු ආකාරය විධානය කළ යුතු ය. තවද, ශ්‍රී ලංකාවෙන් පිටත

සිතාසි භාර දීම සඳහා වූ ඉල්ලීමේ දින සිට මාස හයක් පසු නොවන්නා වූ දිනයක් වන සිතාසියෙහි සඳහන් දින හෝ ඉන් පෙර විත්තිකරු විසින් තම උත්තරය බැඳිය යුතු බවට සහ 55 වන වගන්තියේ වෙනත් නියමයන් අනුව කටයුතු කළ යුතු බවට විධාන කළ යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තියේ "ගාස්තු සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් නියම කිරීමට සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් නියමයන් කර අධිකරණය විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත එය සංශෝධනය කිරීම සඳහා එය ඉදිරිපත් කළ පාර්ශ්වකරු වෙත ආපසු දීම හෝ අධිකරණය විසින් කළ හැකි ය." යන වචන වෙනුවට "ගාස්තු සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයක් සම්බන්ධයෙන් සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියමයන් අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි අතර උත්තරය එසේ ආපසු භාර දෙනු ලැබුවේ යම් දිනයක ද ඒ දින සිට එක් මාසයක් නොඉක්මවන කාලයක් ඇතුළත සංශෝධනය කිරීම සඳහා එය ඉදිරිපත් කළ පාර්ශ්වකරු වෙත ආපසු දීම හෝ අධිකරණය විසින් කළ හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නඩුව විභාග කිරීමේ දිනය.

80. විත්තිකරුගේ උත්තරය බැඳීම සඳහා නියම කරන ලද දින හෝ ප්‍රතිඋත්තරයක් සඳහා අවසර දී ඇති අවස්ථාවක, ඒ ප්‍රතිඋත්තරය බැඳීම සඳහා නියම කරන ලද දින, ඒ උත්තරය හෝ ප්‍රතිඋත්තරය බඳිනු ලැබුව ද නොලැබුව ද, නඩුව විභාග කිරීම සඳහා දිනයක් අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය. තවද 55 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි ලියාපදිංචි ලිපිනයට සපයා ඇත්තා වූ සහ දැන්වීම භාරදීමේ ගාස්තු ඉදිරිපත් කොට ඇත්තා වූ සියලු පාර්ශ්වකරුවන්ට ලියාපදිංචි තැපැල් මගින් ඒ පිළිබඳ ලිඛිත දැන්වීමක් දිය යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"උත්තරවාද සංශෝධනය කිරීම.

93. (1) අධිකරණය විසින්, අසාමාන්‍ය අවස්ථානුගත කරුණු මත හා මාර්ගානුගත කරනු ලැබිය යුතු හේතු නිසා, නඩුවේ යම් විභාගයක දී නැතහොත් නඩුවේ සියලු පාර්ශ්වකරුවන් ඉදිරිපිට යම් අවස්ථාවක දී නැතහොත් ඔවුන් වෙත සාධාරණ කාලයක දැනුම් දීමක් කිරීමෙන් පසු, අවසාන නඩු තීන්දුවට පෙර, නඩුවේ සියලු උත්තරවාද හා අධි

කරණ නියෝග ඒවාට එකතු කිරීමෙන් හෝ ඒවා වෙනස් කිරීමෙන් හෝ අන් හැරීමෙන් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ කරන ලද සංශෝධනය කිරීම සඳහා වූ සෑම ආඥාවක් ම, සුදුසු යයි අධිකරණය විසින් කල්පනා කරනු ලබන නඩු ගාස්තු සම්බන්ධයෙන් සහ උත්තරය හෝ ප්‍රති උත්තරය බැඳීම සඳහා නියම කරන ලද දිනය කල් තැබීම සඳහා හෝ නඩුව විභාග කිරීම හෝ අන්‍ය කාරයක් සඳහා හෝ කරන ලද නියමයන් මත විය යුතු ය.

(3) යම් මුල් අධිකරණයක යම් නඩු ජින්දුවකට කරන ලද සංශෝධන හෝ එකතු කිරීම් ආඥාවෙන් බලපාන ලද උත්තරවාද හෝ අධිකරණ නියෝග මත පැහැදිලිව ලිවිය යුතු ය. නැතහොත් එය පහසුවෙන් කරනු ලැබිය නොහැකි නම් වෙනස් කරන ලද පරිදි වූ ලේඛනයේ පැහැදිලි කෙටුම්පතක් සංශෝධනය කිරීමට අදහස් කරනු ලබන ලේඛන යට ඇමිණිය යුතු ය. එවැනි සෑම සංශෝධනයක ම හෝ වෙනස් කිරීමක ම විනිශ්චයකාරවරයා විසින් ස්වකීය කෙටි අත්සන් යොදනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 143 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 143 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ප්‍රමාණවත් හේතුවක් පෙන්වනු ලැබුවහොත්, නඩුවේ කවර අවස්ථාවක දී වුව ද, පාර්ශ්වකරුවන්ට හෝ පාර්ශ්වකරුවන් අතුරෙන් යම් පාර්ශ්වකරුවකුට කල් දීම ද, නඩුව විභාග කිරීම කලින් කල අඩාලව කල් තැබීම ද අධිකරණය විසින් කළ හැකි ය :

එසේ වුව ද අසාමාන්‍ය අවස්ථානුගත කරුණු අනුව සහ වාර්තා ගත කරනු ලැබිය යුතු හේතු සඳහා හැර, සති හයක් ඉක්මවන අඩාලව කල් තැබීමක් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 183 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 183 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (ආ) ඡේදයෙහි "යම් නිලධරයකු විසින්" යන වචන වෙනුවට "යම් නිලධරයකු විසින් ; නැතහොත්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) දිවුරුම් පත්‍රය දිවුරවනු ලබන්නේ හෝ ප්‍රතිඥා කරවනු ලබන්නේ යම් රටක ද ඒ රටේ නීතිය අනුව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීමට සුදුසුකම් ලත් යම් තැනැත්තකු විසින්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 183අ සහ 183ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 183 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 183අ සහ 183ආ වගන්ති වශයෙන් බල සහිත විය යුතු ය :—

“ නඩුවේ පාර්ශ්ව කරුවන් වෙනුවට දිවුරුම් පත්‍රයක් මගින් දිවිරිය හැකි අය.

183අ. මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ හෝ තත් කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ හෝ දිවුරුම් පත්‍රයක් මගින් දිවුර වීමට යම් තැනැත්තකුට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, එවිට—

(අ) නීතිපතිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව නඩු පවරන ලද අවස්ථාවක, රජයේ යම් නිලධරයකු විසින් ; සහ

(ආ) සංස්ථාවක්, මණ්ඩලයක්, පොදු ආයතනයක් හෝ සමාගමක් විසින් හෝ ඊට විරුද්ධව නඩු පවරන ලද අවස්ථාවක, ඒ සංස්ථාවේ, මණ්ඩලයේ, පොදු ආයතනයේ හෝ සමාගමේ යම් ලේකම්වරයකු, අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු විසින් ; සහ

(ඇ) නඩුවේ යම් පාර්ශ්වකරුවකු ශ්‍රී ලංකාවෙන් පිටත සිටින අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි නඩු පැවරීමට, පවත්වාගෙන යෑමට හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීමට යථා පරිදි බලය ලත් ඔහුගේ ඇටෝර්නි බලකරු විසින් ; සහ

(ඈ) පුද්ගලික දැනීමක් නොමැතිවීම නැතහොත් කායික හෝ මානසික දුබලතාව හේතු කොටගෙන නඩුවේ යම් පාර්ශ්වකරුවකු හෝ නඩුවේ පාර්ශ්වකරුවන් එක් කෙනකුට වඩා වැඩි දෙනකු සිටිනා විට, ඒ පාර්ශ්වකරුවන් අතුරෙන් ශ්‍රී ලංකාවේ වසන යම් පාර්ශ්වකරුවන් විසින් හෝ, මීට ඉහතින් සඳහන් පරිදි වූ පාර්ශ්වකරුගේ ඇටෝර්නි බලකරු විසින් හෝ නියමිත දිවුරුම් පත්‍රය මගින් දිවීමට අපොහොසත් වන අවස්ථාවක, පාර්ශ්වකරුගේ යම් පිළිගත් අනුයෝජිතයකු විසින්,

ඒ කාරණා සම්බන්ධයෙන් නඩුවේ පාර්ශ්වකරු වෙනුවට දිවුරුම් පත්‍රයක් මගින් දිවුරවනු ලැබිය හැකි ය :

එසේ වුවද, ඉහත සඳහන් එක් එක් අවස්ථාවක නඩුවේ පාර්ශ්වකරු වෙනුවට දිවුරුම් පත්‍රය මගින් දිවුරන තැනැත්තා නඩු නිමිත්තෙහි සිද්ධි

සම්බන්ධ පෞද්ගලික දැනුමක් ඇති තැනැත්තකු විය යුතු අතර, දිවුරුම් පත්‍රයෙහි සඳහන් කාරණය සම්බන්ධයෙන් තමාගේ පෞද්ගලික දැනුමෙන් තමා ප්‍රකාශ කරන බව ඔහුගේ දිවුරුම් පත්‍රයෙහි ඔහු විසින් දිවුරා හෝ ප්‍රතිඥා පිට ප්‍රකාශ කළ යුතු ය. තව ද නඩුවේ පාර්ශ්වකරු විසින් දිවුරුම් පත්‍රයක් මගින් දිවුරනු ලැබී නම් විනිශ්චයකාරවරයාගේ අභිමතය අනුව එහි විෂය කරුණු සම්බන්ධයෙන් ඒ පාර්ශ්වකරු යටත් වන ප්‍රශ්න කරනු ලැබීමට ම දිවුරුම් පත්‍රය මගින් දිවුරන්නා ද යටත් විය යුතු ය.

183ආ වගන්තිය යටතේ ඕනෑකමින් කරන අසත්‍ය ප්‍රකාශ සඳහා දඬුවම් කිරීම.

183ආ. ඉහත කී යම් නඩු කටයුත්තක දී දිවුරුම් පත්‍රයකින් හෝ නොඑසේ ව ඕනෑකමින් ම අසත්‍ය ප්‍රකාශයක් කරන යම් තැනැත්තකුට අධිකරණයට අපහාස කිරීමක දී මෙන් දඬුවම් කරනු ලැබිය හැකි අතර, ඒ දඬුවම ඒ ප්‍රකාශය දිවුරුම් පිට හෝ ප්‍රතිඥාවක් පිට හෝ කරනු ලැබූ අවස්ථාවක, බොරු සාක්ෂි දීමේ වරද සඳහා දණ්ඩ නීති සංග්‍රහය යටතේ නඩු විභාග කරනු ලැබීමට හා දඬුවම් කරනු ලැබීමට ද ඔහු යටත් වීමට අමතරව වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 325 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 325 වන වගන්තියේ (4) වන උපවගන්තියේ “පැවැත්විය යුතු ය.” යන වචන වෙනුවට “පැවැත්විය යුතු ය. ඒ සෑම විමර්ශනයක් සහ විභාගයක් ම (2) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම පළ කිරීමේ දින සිට දින හැටක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 326 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 326 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි “නිස්සාර හෝ පීඩාකාරී බවට ; හෝ” යන වචන වෙනුවට “අසද්භාවයෙන් කරන ලද බවට ; හෝ” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 327 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 327 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) “ප්‍රතිරෝධයපෑම හෝ බාධා කිරීම හෝ අවහිර කිරීම හෝ පිටමං කිරීම” යන වචන වෙනුවට “ප්‍රතිරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම හෝ පිටමං කිරීම” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) “අධිකරණය විසින් පෙත්සම නිෂ්ප්‍රභ කරමින් ආඥාවක් කළ යුතු ය.” යන වචන වෙනුවට “ඒ අයිතිවාසිකම් හෝ සම්බන්ධතාව තහවුරු කොට ඇති බව අධිකරණයට පෙනී ගියහොත් අධිකරණය විසින් පෙත්සම නිෂ්ප්‍රභ කරමින් ආඥාවක් කළ යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන්.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 327 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 327අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 327අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"දේපළෙහි කොටසකට පමණක් හිමිකම්පෑම තහවුරු කොට ඇති අවස්ථාවක.

327අ. යම් දේපළක කොටසකට පමණක් යම් හිමිකම්පෑමක් තහවුරු කොට ඇති අවස්ථාවක, ඉහතින් වූ වගන්ති යටතේ කරන ලද යම් ආඥාවක දී ඒ හිමිකම්පෑම තහවුරු කොට නොමැති දේපළෙහි කොටසේ සන්තකයට විනිශ්චිත ණය හිමියා පත් කිරීමට හෝ එහි සන්තකයට ඔහු පුනස්ථාපනය කිරීමට හෝ විධාන කිරීමට අධිකරණයට නිසි බලය ඇත්තේ ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 328 වන වගන්තියේ "ආඥාවක් මගින් විධාන කළ යුතු ය." යන වචන වෙනුවට "ආඥාවක් මගින් විධාන කළ යුතු ය. මේ වගන්තිය යටතේ වූ සෑම විභාගයක් ම, විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා නියම කරන ලද දින සිට වූ දින හැට ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 328 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 338 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 338 වන වගන්තිය සංශෝධනය කිරීම.

(ආ) "නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන් පොල්මෑකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ උරුමය භාරගත් ලගම් නෑයා අදහස් වේ;".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ විට, අධිකරණය විසින් මියගිය තැනැත්තාගේ නම වෙනුවට නීත්‍යානුකූල නියෝජිතයාගේ නම වාර්තාවෙහි සටහන් කළ යුතු අතර, ක්‍රියාවේ යෙදවීම සඳහා වූ ඉල්ලීම නිරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරගෙන යා යුතු ය."; තවද

(2) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) තීන්දු ප්‍රකාශය සම්පූර්ණයෙන් ක්‍රියාවේ යෙදවීමට පෙර විනිශ්චිත ණයහිමියා මිය ගිය හොත්, මිය ගිය තැනැත්තා වෙනුවට තමාගේ නම වාර්තාවෙහි සටහන් කරවා ගැනීමට නීත්‍යානුකූල නියෝජිතයා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය. තවද එවිට අධිකරණය විසින් ඔහුගේ නම වාර්තාවෙහි සටහන් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 394 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 394 වන වගන්තියේ (2) වන උපවගන්තියේ 'නීත්‍යානුකූල නියෝජිතයා' යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'"නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන්, පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ උරුමය භාරගත් ළඟම නෑයා අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 437 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 437 වන වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"දිවුරුම්පත්‍ර මත වූ සාක්ෂි.

437. දිවුරුම් පත්‍රයක් මත සාක්ෂි ලබාගන්නා ලෙස යම් අධිකරණයක් විසින් යම් ආඥාවක් කර ඇති කවර හෝ විටෙක නැතහොත් යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් හෝ දැනටමත් පවරා ඇති හෝ පැවරීමට ආසන්න ලඝු කාර්ය පටිපාටිය අනුව වූ නඩුවක් සම්බන්ධයෙන් හෝ ඉදිරිපත් කිරීම සඳහා දිවුරුම් පත්‍රයක් මත සාක්ෂි අවශ්‍ය වූ කවර හෝ විටෙක, දිවුරුම් පත්‍රයෙහි ඇතුළත් ප්‍රකාශය තමා කළ බව කියා සිටින තැනැත්තා ලවා යම් අධිකරණයක් හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරියෙහි 181 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව දිවුරුම් පත්‍රයක් හෝ සිද්ධි පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් දිවුරවීම හෝ ප්‍රතිඥාදීම හෝ කරවනු ලැබිය හැකි ය. නැතහොත් ශ්‍රී ලංකාවෙන් පිටත රටක දී ඒ රටේ නීතියට අනුකූලව දිවුරුම් ගැනීමට හෝ ප්‍රතිඥා කරවීමට සුදුසුකම් ලත් යම් තැනැත්තකු ඉදිරියේ දිවුරන ලද හෝ ප්‍රතිඥා කරන ලද දිවුරුම් පත්‍රයක් සම්බන්ධයෙන් වන විට අධිකරණයේ නාම, නඩුවේ අංකය සහ පාර්ශ්වකරුවන්ගේ නම් ඒ දිවුරුම් පත්‍රයෙහි මුහුණතෙහි සඳහන් වී තිබීම ම, දිවුරුම ගැනීමට හෝ ප්‍රතිඥාව කරවීමට ඒ අධිකරණයට හෝ සමාදාන විනිශ්චයකාරවරයාට හෝ දිවුරුම් කොමසාරිස්වරයාට හෝ දිවුරුම හෝ ප්‍රතිඥාව කරවීමට සුදුසුකම් ලත් ඒ වෙනත් තැනැත්තාට ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 438 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 438 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" දිවුරුම් පත්‍රය ප්‍රකාශක විසින් අත්සන් කළයුතු බව.

438. ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව සාදන ලද සෑම දිවුරුම් පත්‍රයක් ම, එය දිවුරවනු ලබන්නේ හෝ ප්‍රතිඥා කරවනු ලබන්නේ යම් අධිකරණයක්, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස් වරයකු හෝ සුදුසුකම් ලත් තැනැත්තකු ඉදිරියේ ද ඒ අධිකරණය, සමාදාන විනිශ්චයකාරවරයා, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සුදුසුකම් ලත් තැනැත්තා ඉදිරියේ දී ප්‍රකාශක විසින් එය අත්සන් කළ යුතු ය. ".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 439 වන වගන්තියේ " සාමදාන විනිශ්චයකාරවරයා හෝ කොමසාරිස්වරයා " යන වචන ඒ වගන්තියේ යෙදෙන කවර හෝ විටෙක, ඒ වචන වෙනුවට " එය දිවුරවනු ලබන හෝ ප්‍රතිඥා කරවනු ලබන සමාදාන විනිශ්චයකාරවරයා, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සුදුසුකම් ලත් තැනැත්තා " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 439 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 440 වන වගන්තියේ " සාම විනිශ්චය කාරවරයකු හෝ කොමසාරිස්වරයකු ඉදිරිපිට ද ඉහත කී සෑම කපා හැරීමකට හා අතර ලිවීමකට ම ඒ විනිශ්චයකාරවරයා, සාම විනිශ්චය කාරවරයා හෝ කොමසාරිස්වරයා විසින් තම කෙටි අත්සන තබනු ලැබිය යුතු ය. " යන වචන වෙනුවට " සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු හෝ සුදුසුකම් ලත් තැනැත්තකු ඉදිරිපිට ද ඉහත කී සෑම කපා හැරීමකට ම හා අතර ලිවීමකට ම ඒ සමාදාන විනිශ්චයකාරවරයා, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සුදුසුකම් ලත් තැනැත්තා විසින් තම කෙටි අත්සන තබනු ලැබිය යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 440 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 519 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 519 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ " එවැනි යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට ද, එවැනි යම් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතත් නැතත් අන්තිම කැමති පත්‍රකරුගේ බූදලය වටිනාකමින් රුපියල් විසිදාහක් හෝ ඊට වැඩි වන සෑම අවස්ථාවකදී ද " යන වචන වෙනුවට " එවැනි යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "බුදලයේ වටිනාකම රුපියල් විසිදාහක් හෝ ඊට වැඩි වන අවස්ථාවක ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය අනිවාර්ය බව" යන වචන වෙනුවට "ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 522 වන වගන්තිය සංශෝධනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 522 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(2) එහි (ඈ) සහ (ඉ) ඡේද පිළිවෙළින් (ඇ) සහ (ඈ) ඡේද වශයෙන් නැවත අංක කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 524 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 524 වන වගන්තියෙහි (4) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) පෙත්සම්කරු විසින් පෙත්සම සමග—

(අ) නයිසයි ආඥාවේ කෙටුම්පත ;

(ආ) නයිසයි ආඥාව සඳහා සහ එය භාරදීම සඳහා අවශ්‍ය මුද්දර ;

(ඇ) පළමුවන උපලේඛනයේ 84 අ ආකෘතියෙහි නයිසයි ආඥාව පිළිබඳ දැන්වීමේ කෙටුම්පත ;

(ඈ) තම ඉල්ලීමට කැමැත්ත දීම වශයෙන් ඒ වගඋත්තර කරුවන් විසින් ලියවිල්ලකින් දෙන ලද කැමැත්ත දැක්වීම

ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 525 වන වගන්තිය සංශෝධනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 525 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) පෙත්සම්කරු විසින් පෙත්සම සමඟ—

(අ) නියත ආඥාවේ කෙටුම්පත ;

(ආ) ඒ නියත ආඥාව සඳහා අවශ්‍ය මුද්දර ;

(ඇ) පළමුවන උපලේඛනයෙහි අංක 84 ආ ආකෘතියෙහි නියත ආඥාව පිළිබඳ දැන්වීමේ කෙටුම්පත

ඉදිරිපත් කළ යුතු ය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 530 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 530 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවක අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා ඉල්ලුම් කළ යුතු ආකාරය සහ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ඔප්පු කිරීමේ ක්‍රමය.

530. (1) අන්තිම කැමති පත්‍රයක් නොමැතිව යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ මියයන අවස්ථාවක, නැතහොත් ඔහු විසින් අන්තිම කැමති පත්‍රයක් සාදනු ලැබ එය සොයාගනු නොලබන්නා වූ අවස්ථාවක, ඔහුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම අනිවාර්ය නොවිය යුතු ය. එහෙත් මියගිය තැනැත්තාගේ ඒ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම අපේක්ෂා කරනු ලැබුවහොත්, ඔහුගේ දේපළ පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා වූ ඉල්ලීමක් ඉල්ලුම්කරු පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ හෝ මියගිය තැනැත්තාගේ මරණය සිදුවූ අවස්ථාවේ දී ඔහු පදිංචිව සිටි දිස්ත්‍රික්කයේ හෝ මියගිය තැනැත්තාගේ බූදලයට අයත් යම් ඉඩමක් පිහිටි දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම ඉල්ලීමක් ම, ලඝු කාර්ය පරිපාටිය අනුව පෙත්සමක මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, එම පෙත්සමෙහි අන්තිම කැමති පත්‍රය නොමැති බව, මියගිය තැනැත්තාගේ මරණය සහ පෙත්සම්කරුගේ උපරිම දැනීම අනුව මියගිය තැනැත්තාගේ උරුමක්කාරයන් සම්බන්ධයෙන් අදාළ සිද්ධීන් 524 වන වගන්තියෙන් නියමිත පරිදි අංක කරන ලද ඡේදවලින් දැක්විය යුතු ය. පෙත්සම්කරු හිමිකම් පා සිටින්නේ කවර තත්ත්වයකින් ද යන්න සහ ඔහු විසින් එසේ කිරීම යුක්ති සහගත කෙරෙන සිද්ධීන් ද පෙත්සමෙහි දැක්විය යුතු ය. පෙත්සමෙහි ඇතුළත් වැදගත් කියාපෑම් සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි වන පරිදි ප්‍රමාණවත් සාක්ෂි මගින් ද ඉල්ලීම සනාථ කරනු ලැබිය යුතු ය. තව ද මියගිය තැනැත්තාගේ ළඟම නෑයන් වගඋත්තරකරුවන් වශයෙන් නම් කළ යුතු ය.

(2) (අ) පෙත්සම්කරු විසින් පෙත්සම සමග—

(i) නයිසයි ආඥාවේ කෙටුම්පත;

(ii) නයිසයි ආඥාව සඳහා සහ එය භාර දීම සඳහා අවශ්‍ය මුද්දර;

(iii) පළමුවන උපලේඛනයේ අංක 84අ ආකෘතිය අනුව වූ නයිසයි ආඥාව සම්බන්ධයෙන් දැන්වීමේ කෙටුම්පත

ඉදිරිපත් කළ යුතු ය.

(ආ) තව ද, පෙත්සම්කරුගේ ඉල්ලීමට කැමැත්ත දීමක් වශයෙන් ඒ වගඋත්තර කරුවන්ගේ ලිඛිත කැමැත්ත පෙත්සම්කරු විසින් පෙත්සම සමඟ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 531අ සහ 531ආ වගන්ති ඉවත් කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 531අ සහ 531ආ වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 537 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 537 වන වගන්තියේ " මෙහි මීට පෙර නියම කරනු ලැබූ ලඝු කාර්ය පටිපාටිමය රීති අනුව " යන වචන වෙනුවට " ලඝු කාර්ය පටිපාටිය අනුව " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 539 අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 539අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නඩුව පවතින අතර අද්මිනිස්ත්‍රාසි කිරීම.

539අ. (1) මියගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රයෙහි වලංගු භාවය සම්බන්ධ වූ හෝ ප්‍රොබේට් බලපත්‍රයේ හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයේ ප්‍රදානය ලබා ගැනීම සඳහා ආපසු කැඳවීම සඳහා හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ වූ හෝ යම් නඩු කටයුත්තක් විනිශ්චයට භාජනව පවත්නා අවස්ථාවක, අනිසි ලෙස ප්‍රමාද වීමේ හේතුව මත—

(i) මියගිය තැනැත්තාගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපත්‍රය ඒ නඩු කටයුත්ත පවත්නා කාලය සඳහා සීමා කොට ප්‍රදානය කළ හැකි ය. එහෙත් ඒ අද්මිනිස්ත්‍රාසිකරු තෙලින් ම අධිකරණයේ පාලනයට යටත් විය යුතු අතර එහි විධානය යටතේ ක්‍රියා කළ යුතු ය. තව ද, බූදලය පවත්නා කාලය සඳහා සීමා කොට ප්‍රදානය බෙදා දීමේ අයිතිවාසිකම අද්මිනිස්ත්‍රාසිකරුට නොතිබිය යුතු ය ; තවද

(ii) ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීමට පෙරාතුව මියගිය තැනැත්තාගේ බූදලයට අයත් යම් දේපළක් විකිණීමට අවශ්‍ය වෙතොත්, ඒ දේපළ විකිණීමේ කාර්යය සඳහා සීමා වූ බලපත්‍රයක් අධිකරණය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) එවිට, ඒ දේපළ ප්‍රදානයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව බලපත්‍ර නිකුත් කරනු ලැබූ බව ඒ ප්‍රදානයෙහි ප්‍රකාශිත ලෙස ම සඳහන් කරනු ලැබිය යුතු ය:—

(අ) විකිණීම පෞද්ගලික ගිවිසුමක් මගින් කරනු ලැබුවහොත්, අධිකරණය විසින් නියම කරනු ලබන මිලකට විකිණීම කළ යුතු බව; නැතහොත් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණීම කරනු ලැබුවහොත් අඩුම වෙන්දේසි මිලට හෝ අන්‍යාකාර යක් අනුව විකිණීම කළ යුතු බව;

(ආ) අධිකරණය විසින් නියම කරනු ලබන යම් කාලයක් ඇතුළත විකිණීමෙන් ලත් මුදල් අධිකරණයෙහි තැන්පත් කළ යුතු බව;

(ඇ) අධිකරණය විසින් විකිණීම ස්ථිර කිරීමට පෙරාතුව නිශ්චල දේපළ සමර්පනය කිරීමේ යම් ඔප්පුවක් ලියා අත්සන් කිරීමට, බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් අද්මිනිස්ත්‍රාසිකරුවකුට ද ඒ අද්මිනිස්ත්‍රාසිකරුට බලය පවරා දී නොමැති බව; සහ

(ඈ) අවස්ථානුගත කරුණු අනුව පැනවීම සුදුසු යයි අධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් නියමයක්.

(3) මේ වගන්තිය යටතේ බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා යම් ඉල්ලුමක් කිරීමට පෙර, ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා වූ මුල් පෙත්සමෙහි වගඋත්තරකරුවන්ට ඉල්ලීම සම්බන්ධයෙන් දැන්වීමක් දෙනු ලැබිය යුතු අතර ඔවුන් හෝ බූදලයෙහි සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු ඒ විකිණීමට කැමැත්ත ප්‍රකාශ කොට ඇත්නම් මිස, ඊට විරුද්ධව ඔවුන්ට හෝ ඔවුන්ගෙන් යම් තැනැත්තකුට හෝ කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතු ය.''

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 539ආ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 539ආ වගන්තිය ඉවත් කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 542 වන සහ 543 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 542 වන සහ 543 වන වගන්ති ඉවත් කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 545 වන වගන්තිය ඉවත් කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 545 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 546 වන වගන්තිය සංශෝධනය කිරීම.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 546 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි " හිමිකම් ඇති යම් ළඟම නෑයකු හෝ වෙනත් තැනැත්තකු ඒ විනිශ්චයකාරවරයාගේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ නොසිටින බව" යන වචන වෙනුවට " හිමිකම් ඇති කිසිම ළඟම නෑයකු නොසිටින බව" යන වචන ආදේශ කිරීමෙන්.

(2) එහි " ඒ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීමට " යන වචන වෙනුවට " උරුමක්කරුවකු මගින් හෝ ඒ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීමට " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 547 වන වගන්තිය ඉවත් කිරීම.

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 547 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 553 වන වගන්තිය සංශෝධනය කිරීම.

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 553 වන වගන්තියේ " ඒ සමගම අධිකරණයට ගෙවිය හැකි ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" ඒ සමගම අධිකරණයට ගෙවිය හැකි ය :

එසේ වුව ද පාර්ශ්වකරුවන් කැමැත්ත දෙන අවස්ථාවක, ඒ ගිණුම ඉදිරිපත් කරනු ලැබුවේ නම් ගෙවිය යුතු වන මුද්දර ගාස්තුව ගෙවනු ලැබූ විට, ඒ ගිණුම ඉදිරිපත් කිරීම සහ ගෙවීම අත්හරිනු ලැබිය යුතු අතර, එවිට නඩු කටයුතු අවසන් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 554අ වගන්තිය සංශෝධනය කිරීම.

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 554අ වගන්තියේ " එහෙත් වටිනාකමෙන් රුපියල් විසි දහසකට අඩු මුදලයක් තබා" යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 554ම වගන්තිය සංශෝධනය කිරීම.

40. ප්‍රධාන ප්‍රඥප්තියේ 554ම වගන්තියේ " ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 15 වන වගන්තිය යටතේ " යන වචන වෙනුවට " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 582 වන වගන්තිය සංශෝධනය කිරීම.

41. ප්‍රධාන ප්‍රඥප්තියේ 582 වන වගන්තියේ පළමුවන අතුරු වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" එසේ වුව ද බාලවයස්කරුවකුගේ යම් ඥාතියකුට දේපළ ආරක්ෂකත්ව සහතිකයක් ප්‍රදානය කොට

නොමැති වුව ද බාලවයස්කරු වෙනුවෙන් නඩුවක් පැවරීමට හෝ එවැනි නඩුවක දී විත්තිවාචක ඉදිරිපත් කිරීමට ඒ බාලවයස්කරුගේ ඥාතියාට අවසරදීම අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් සහතික කළ හැකි ය.".

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 584 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 584 වන වගන්තිය ඉවත් කිරීම.

43. ප්‍රධාන ප්‍රඥප්තියේ 655 වන සහ 656 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 655. සහ 656 වන වගන්ති ඉවත් කිරීම.

44. ප්‍රධාන ප්‍රඥප්තියේ 663 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 663 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඉන්ජන්ෂන් තහනමකට හෝ වාරණ නියෝගයකට අකීකරුවීම සම්බන්ධයෙන් දඬුවම් කළ යුතු ආකාරය.

663. ඉන්ජන්ෂන් තහනමක් සඳහා හෝ වාරණ නියෝගයක් සඳහා වූ යම් ඉල්ලීමක් මත, අධිකරණය විසින් ප්‍රදානය කරන ලද ඉන්ජන්ෂන් තහනමකට හෝ වාරණ නියෝගයකට අකීකරු වන අවස්ථාවක, අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් දඬුවම් කරන ආකාරයෙන් ඒ වරද කරන්නාට දඬුවම් කිරීමෙන් ඉන්ජන්ෂන් තහනමක් හෝ වාරණ නියෝගයක් බලාත්මක කරනු ලැබිය හැකි ය.".

45. ප්‍රධාන ප්‍රඥප්තියේ 664 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 664 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඉන්ජන්ෂන් තහනමක් සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වකරුට දැන්වීමක් කළ යුතු බව.

664. (1) ඉන්ජන්ෂන් තහනමක් ප්‍රදානය කිරීමට පෙර අධිකරණය විසින්, ඒ සඳහා වූ ඉල්ලීමේ පෙත්සම, ඒ සමඟ වූ දිවුරුම් පත්‍රය සමඟ විරුද්ධ පාර්ශ්වකරුට භාරදීමට සැලැස්විය යුතු ය.

(2) ඉන්ජන්ෂන් තහනමක් ප්‍රදානය කිරීමේ අරමුණ, ප්‍රමාදවීමෙන් ව්‍යර්ථ වන බව අධිකරණයට පෙනී යන අවස්ථාවක, ඉන්ජන්ෂන් තහනමක් සඳහා වූ ඉල්ලීම විභාග කොට තීරණය කරනු ලබන තෙක් මුල් අවස්ථාවේ දී අධිකරණය විසින් දින දහ හතරක් නොඉක්මවන කාලසීමාවක් සඳහා විත්තිකරු වාරණය කරනු ලැබිය හැකි ය. අධිකරණය විසින්, යහපත් සහ ප්‍රමාණවත් වූ සහ වාර්තාගත කළ යුතු හේතු මත, එසේ නිකුත් කරනු ලැබූ වාරණ නියෝගයක්

ක්‍රියාත්මකවීම වරකට දින දහහතරක කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය. මේ විධිවිධාන යටතේ කරන ලද වාරණ නියෝගයක් ඉන්ජන් ෂන් තහනමක් ප්‍රදානය කිරීම සඳහා වූ ඉල්ලීම විභාග කොට තීරණය කිරීම මත අවලංගු වන් නේ ය.

(3) වැදගත් කරුණු කිසිවක් යටපත් කිරීමෙන් හෝ දුරර්පණය කිරීමෙන් (2) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද වාරණ නියෝගයක් ලබාගත් බවට අධිකරණය සෑහීමට පත් වෙතොත්, ඒ ආඥාව ක්‍රියාත්මක කිරීම අධිකරණය විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ යම් පාර්ශ්වකරුවකු විසින් කරන ලද ඉල්ලීමක් මත, අත්හිටවනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 665 වන වගන්තිය සංශෝධනය කිරීම.

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 665 වන වගන්තියේ "නිකුත් කරනු ලැබූ ඉන්ජන්ෂන් තහනමකින්" යන වචන වෙනුවට "නිකුත් කරනු ලැබූ ඉන්ජන්ෂන් තහනමකින් හෝ වාරණ නියෝගයකින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 666 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ 666 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ආඥාව ඉවත දැමිය යුතු හෝ වෙනස් කළ යුතු ආකාරය.

666. මේ පරිච්ඡේදය යටතේ ඉන්ජන්ෂන් තහනමක් සඳහා කරනු ලැබූ ආඥාවකින් හෝ වාරණ නියෝගයකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකු විසින් ඒ සඳහා අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් ඒ ආඥාව හෝ නියෝගය අවලංගු කළ හැකි ය ; නැත හොත් වෙනස් කළ හැකිය ; නැතහොත් ඉවත දැමිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 667 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ 667 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අධිකරණය විසින් වන්දි ප්‍රදානය කළ හැකි අවස්ථා.

667. ප්‍රමාණවත් හේතු නොමැතිව ඉන්ජන්ෂන් තහනම හෝ වාරණ නියෝගය ඉල්ලුම්කර ඇති බව අධිකරණයට පෙනී ගියහොත්, නැතහොත් ප්‍රදානය කරනු ලැබූ ඉන්ජන්ෂන් තහනම හෝ වාරණ නියෝගය නිකුත් කිරීමෙන් පසුව, පැහැර හැරීම හෝ වෙනත් යම් කරුණක් හෝ නිසා නඩුව නිෂ්ප්‍රභ කරනු ලැබුවහොත් නැතහොත් ඉල්ලුම්කරුට විරුද්ධව නඩු තීන්දුව දෙනු ලැබුවහොත්, සහ ඉන්

ජන්ෂන් තහනම හෝ වාරණ නියෝගය සඳහා ඉල්ලුම් කිරීමට සම්භාවී හේතුවක් නොතිබුණේ යයි අධිකරණයට පෙනී ගියහොත්, ඉන්ජන්ෂන් තහනම හෝ වාරණ නියෝගය නිකුත් කරනු ලැබුවේ යම් පාර්ශ්වකරුවකුට විරුද්ධව ද ඒ පාර්ශ්වකරුට ඉන්ජන්ෂන් තහනම හෝ වාරණ නියෝගය නිකුත් කිරීම නිසා සිදු වූ වියදම් හෝ හානිය සඳහා ඒ පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක දී ඒ වියදම් හෝ හානිය සම්බන්ධයෙන් සාධාරණ වන්දියක් වශයෙන්, අධිකරණය විසින් සලකනු ලබන මුදල් ප්‍රමාණයක් ඉන්ජන්ෂන් තහනම හෝ වාරණ නියෝගය ලබාගත් පාර්ශ්වකරුවකුට විරුද්ධව ස්වකීය තීන්දු ප්‍රකාශයෙන් අධිකරණය විසින් ප්‍රදානය කළ හැකි ය. ඉන්ජන්ෂන් තහනම හෝ වාරණ නියෝගය නිකුත් කිරීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා යම් නඩු පැවරීමකට මේ වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රදානය බාධාවක් වන්නේ ය.".

49. ප්‍රධාන ප්‍රඥප්තියේ 753 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 753 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ප්‍රතිශෝධනය කිරීමට අභියාචනාධිකරණයට ඇති බලතල.

753. යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින් කරනු ලැබූ යම් නඩු තීන්දුවක හෝ ආඥාවක නීත්‍යනුකූල භාවය හෝ උචිත භාවය නැතහොත් ඒ අධිකරණයේ, විනිශ්චයාධිකාරයේ හෝ වෙනත් ආයතනයේ නඩු කටයුත්තෙහි විධිමත් භාවය පිළිබඳව සෑහීමට පත් වීමේ කාර්යය සඳහා, යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින් එවකටත් නඩු විභාග කරනු ලැබ ඇති හෝ එහි විනිශ්චයට භාජනව පවත්නා හෝ යම් නඩුවක වාර්තාව ගෙන්වා ගැනීම හා පරීක්ෂා කර බැලීම අභියාචනාධිකරණය විසින් ස්වකීය මෙහෙය වීමෙන් ම හෝ යම් ඉල්ලීමක් මත කරනු ලැබිය හැකි ය. තව ද, අභියාචනාධිකරණය ඉදිරියට ගෙන එනු ලැබූ නඩුව ප්‍රතිශෝධනය කරනු ලැබූ විට, ඒ නඩුව පිළිබඳව යුක්තියේ අවශ්‍යතා අනුව යම් නඩු තීන්දුවක් හෝ ඒ පිළිබඳ යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.".

50. ප්‍රධාන ප්‍රඥප්තියේ 754 වන වගන්තියේ සිට 760අ වන වගන්තිය දක්වා වූ වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 754 වන වගන්තියේ සිට 760අ වන වගන්තිය දක්වා වූ වගන්ති ප්‍රතියෝජනය කිරීම.

" අභියාචනයක් ඉදිරිපත් කිරීමේ ක්‍රමය.

754. (1) තමා පාර්ශ්වකරුවකු වූ යම් සිවිල් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් සම්බන්ධයෙන් යම් මුල් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවකින්, අතෘප්ති

යට පත් යම් තැනැත්තකු විසින් සිද්ධිය පිළිබඳව වූ හෝ නීතිය පිළිබඳව වූ යම් දෝෂයක් සම්බන්ධයෙන් ඒ නඩු තීන්දුවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(2) තමා පාර්ශ්වකරුවකු වන හෝ පාර්ශ්වකරුවකු වීමට බලාපොරොත්තු වන යම් සිවිල් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් පවත්වා ගෙන යන අතරතුර යම් මුල් අධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් අභියාචනාධිකරණයේ අවසරය පළමු කොට ඇතිව හා ලබාගෙන, සිද්ධිය පිළිබඳව වූ හෝ නීතිය පිළිබඳව වූ යම් දෝෂයක් නිරවද්‍ය කරවා ගැනීම සඳහා ඒ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(3) යම් මුල් අධිකරණයක යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව අභියාචනාධිකරණය වෙත කරනු ලබන සෑම අභියාචනයක් ම, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති කාලය ඇතුළත හා නියමිත ආකෘතියෙහි නියමිත ආකාරයෙන් මුල් අධිකරණය වෙත අභියාචන දැන්වීමක් කිරීමෙන්, ඉදිරිපත් කළ යුතු ය.

(4) අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් ආඥාවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද ඒ ආඥාව හෝ තීන්දු ප්‍රකාශය ප්‍රකාශයට පත් කරන ලද දින සිට ඒ දිනය, පෙත්සම ඉදිරිපත් කරන දිනය, ඉරිදා දින සහ රජයේ නිවාඩු දින ද හැර දවස් දහහතරක කාලයක් ඇතුළත, අභියාචක පාර්ශ්වකරු විසින් හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා විසින් හෝ අභියාචන දැන්වීම මේ කාර්යය සඳහා මුල් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද, එම දැන්වීම එසේ ඉදිරිපත් කරන ලද්දේ යම් අධිකරණයකට ද ඒ අධිකරණය විසින් එම දැන්වීම භාර ගෙන ඒ පිළිබඳව මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් කටයුතු කළ යුතු ය. ඒ කොන්දේසි සපුරා නොතිබුණහොත් එම දැන්වීම භාර ගැනීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(5) මේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා—

"නඩු තීන්දුව" යන්නෙන් යම් සිවිල් අධිකරණයක් විසින් කරන ලද අවසාන නඩු තීන්දුවක ප්‍රතිඵලය ඇති යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් අදහස් වේ ; තව ද

"ආඥාව" යන්නෙන් යම් සිවිල් නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක නඩු තීන්දු

වක් නොවන යම් තීරණයක් අවසාන වශයෙන් ප්‍රකාශයට පත් කිරීම අදහස් වේ.

අභියාචන දැන්වීම.

755. (1) සෑම අභියාචන දැන්වීමක් ම හොඳ හා සුදුසු කඩදාසියක පැහැදිලිව ලිවිය යුතු අතර, අභියාචක විසින් හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා විසින් අත්සන් කර යථා පරිදි මුද්දර අලවා තිබිය යුතු ය. තව ද ඒ දැන්වීමෙහි පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය:—

(අ) අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණයේ නම ;

(ආ) නඩුවේ අංකය ;

(ඇ) නඩුවේ පාර්ශ්වකරුවන්ගේ නම් සහ ලිපිනයන් ;

(ඈ) අභියාචකගේ සහ වගඋත්තරකරුගේ නම් ;

(ඉ) ඉල්ලා සිටින සහනයේ ස්වභාවය :

එසේ වුව ද, අභියාචනය නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී මුද්දර කිසිවක් අවශ්‍ය නොවන්නේ ය.

(2) අභියාචන දැන්වීම සමග—

(අ) මෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සාදන ලද රීතිවලින් නියම කරනු ලැබූ ප්‍රමාණය හා ස්වභාවය අනුව, වගඋත්තරකරුගේ අභියාචන ගාස්තු සඳහා ඇප යක් නැතහොත් වගඋත්තරකරු විසින් හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා විසින් අත්සන් කරන ලද ඇප භාර ගැනීමේ හෝ අත් හැරීමේ ලියවිල්ල ; සහ

(ආ) වගඋත්තරකරු වෙත හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා වෙත අභියාචන දැන්වීමේ පිටපතක් භාරදෙනු ලැබූ බවට සාක්ෂි වශයෙන් ඒ දැන්වීම ලැබුණු බව දැක්වෙන ලියවිල්ලක් හෝ ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය

ඉදිරිපත් කළ යුතු ය.

(3) සෑම අභියාචකයකු විසින් ම, අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද ඒ නඩු තීන්දුවේ හෝ තීන්දු ප්‍රකාශයේ දින සිට දින හැටක් ඇතුළත, අභියාචනය උද්ගත වන්නේ කවර අවස්ථානුගත කරුණුවලින් ද යන වග සහ

අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද, එයට විරුද්ධ වීමට ඇති හේතු ගෙන හැර දක්වන්නා වූ ද 758 වන වගන්තියේ නියමිත තොරතුරු ඇතුළත් වන්නා වූ ද අභියාචන පෙත්සමක් මුල් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය. එම පෙත්සම අභියාචක විසින් හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා විසින් හෝ අත්සන් කර තිබිය යුතු ය. ඒ අභියාචන පෙත්සම මුද්දර ගාස්තුවෙන් නිදහස් වන්නේ ය:

එසේ වුව ද අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද ඒ නඩු තීන්දුවේ හෝ තීන්දු ප්‍රකාශයේ දින සිට දින හැටක් ඇතුළත මුල් අධිකරණය වෙත ඒ පෙත්සම ඉදිරිපත් කරනු නොලැබුවේ නම්, අධිකරණය විසින් අභියාචනය භාර ගැනීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

(4) අභියාචන පෙත්සම ඉදිරිපත් කරන ලද විට, අධිකරණය විසින්, අභියාචන පෙත්සම සහ ඒ සමග අභියාචනය කර ඇත්තේ යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද ඒ නඩු තීන්දුවට හෝ තීන්දු ප්‍රකාශයට අදාළ නඩුවේ සියලු ලේඛන සහ නඩු කටයුතු හැකි ඉක්මණින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද, අවශ්‍ය වුවහොත්, ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා අභියාචනයට විෂයය වී ඇති නඩු තීන්දුවේ හෝ තීන්දු ප්‍රකාශයේ කාර්යාලයීය පිටපතක් තබා ගත යුතු ය. එම නඩු කටයුතු වාර්තා සමග එම නඩුව අවසන් කරනු ලැබූ සහ එය තීරණය කරනු ලැබූ දිනයන් ද, එහි තීරණය දෙන ලද්දේ කවුරුන්ගේ වාසියට ද, අභියාචනා ඇන්වීම සහ අභියාචන පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ දිනයන් ද, අභියාචනය කරනු ලැබුවේ යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද, ඒ නඩු තීන්දුවට හෝ තීන්දු ප්‍රකාශයට විරුද්ධව අභියාචනයක් කිරීමේ අයිතිවාසිකම ඇති බවට හෝ නොමැති බවට විනිශ්චයකාරවරයාගේ මතය ද ප්‍රකාශ කරන අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකයක් ද ඉදිරිපත් කළ යුතු ය.

(5) අභියාචන පෙත්සම ලැබුණු විට, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, එම පෙත්සමට අංකයක් නොපමාව යෙදිය යුතු අතර එම අංකය අභියාචන ලේඛනයෙහි ඇතුළත් කර අදාළ පාර්ශ්වකරුවන්ට ලියාපදිංචි තැපැල් මගින් දැනුම් දිය යුතු ය:

එසේ වුව ද, අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද ඒ නඩු තීන්දුවට හෝ තීන්දු ප්‍රකාශයට විරුද්ධව අභියාචනය කිරීමේ අයිතිවාසිකමක් නොමැති බවට මතයක් මුල් අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ප්‍රකාශ කර ඇති විට, රෙජිස්ට්‍රාර්වරයා විසින්, අභියාචන පෙත්සම අභියාචනාධිකරණයේ සභාපතිවරයා වෙත හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් නම් කරන ලද වෙනත් යම් විනිශ්චයකාරවරයකු වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ විනිශ්චයකාරවරයා විසින් නියම කරන දිනයක, පෙත්සම්කරු විසින් හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් හෝ පෙත්සම විවෘත අධිකරණයෙහි සනාථ කරනු ලැබිය යුතු බවට නියම කළ යුතු ය. තව ද, අධිකරණය විසින් පෙත්සම්කරුට හෝ ඔහුගේ නීතිඥවරයාට සවන් දීමෙන් පසුව, ඒ පෙත්සම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. නැතහොත්, පෙත්සම විභාග කිරීම සඳහා දිනයක් නියම කළ හැකි අතර ඉන් පසුව වගඋත්තරකරු වෙත හෝ වගඋත්තරකරුවන් වෙත දැන්වීමක් නිකුත් කරන ලෙස ආඥාවක් කළ හැකි ය :

එසේම තවදුරටත් මේ වගන්තිය යටතේ වූ පෙත්සමක් ප්‍රතික්ෂේප කරනු ලබන විට, ඒ ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු අධිකරණය විසින් වාර්තා ගත කළ යුතු ය.

**ඇපකරුවකු සමග බැඳුම්කරයකින් ඇප දිය යුතු බව.**

756. (1) අභියාචක පාර්ශ්වකරුවකු විසින් තැබිය යුතු ඇපය, (පළමුවන උපලේඛනයේ අංක 129 දරන ආකෘතිය) පිළිගත හැකි ප්‍රමාණවත් එක් ඇපකරුවකු හෝ ඊට වැඩි ගණනක් සහිතව බැඳුම්කරයකින් විය යුතු ය. නැතහොත් නිශ්චල දේපළ උකස් කිරීමකින් හෝ අභියාචනයෙහි ගාස්තු පියවීමට ප්‍රමාණවත් වන හා ඊට වැඩි නොවන මුදලක් ඇප වශයෙන් තැන්පත් කර බැඳ තබන බැඳුම්කරයකින් විය යුතු ය.

(2) අභියාචක—

(අ) නීතිපතිවරයා ;

(ආ) නඩු තීන්දුව තොක් දික්කසාද දීමනාව ගෙවීමේ ආඥාවක් විවාහ නඩුවක දී **ස්වාමි පුරුෂයාගේ/භාර්යාවගේ වාසියට** කරනු ලැබ ඇත්තේ ද ඒ ස්වාමි පුරුෂයා/භාර්යාව ; හෝ

(ඇ) බුන්වත් බව පිළිබඳ නඩු කටයුතු සම්බන්ධයෙන් බුන්වත් නැනැත්තකු;

(ඈ) වෙනත් යම් ලිඛිත නීතියක් මගින් ඇප තැබීමෙන් නිදහස් කරනු ලැබූ තැනැත්තකු

වන අවස්ථාවක ඇපය අත්හැරිය යුතු ය.

**අභියාචනා කිරීමට අවසර ඉල්ලීම** පිළිබඳ කාර්ය පටිපාටිය.

757. (1) අධිකරණයක් විසින් යම් සිවිල් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් පවත්වාගෙන යන අතරතුර කරන ලද ආඥාවකට විරුද්ධව අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම අතෘප්තියට පත් පාර්ශ්වකරු විසින් හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා විසින් අත්සන් කරනු ලැබ සහ යථා පරිදි මුද්දර අලවනු ලැබ අභියාචනාධිකරණය අමතනු ලැබූ පෙත්සමක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ඒ පෙත්සම දිවුරුම් පත්‍රයක් මගින් සනාථ කරනු ලැබ තිබිය යුතු ය. තව ද 758 වන වගන්තියෙන් නියමිත විස්තර, එහි ඇතුළත් විය යුතු අතර අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් ආඥාවකට විරුද්ධව ද, ඒ ආඥාව ප්‍රකාශ කරන ලද දිනය සහ ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන දිනය, ඉරිදා දින සහ රජයේ නිවාඩු දිනයන් අත්හැර ඒ ආඥාව ප්‍රකාශයට පත් කරනු ලැබූ දින සිට දින දහහතරක කාලසීමාවක් ඇතුළත අභියාචක පාර්ශ්වකරු විසින් හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා විසින් හෝ අභියාචනාධිකරණය වෙත එය ඉදිරිපත් කළ යුතු ය. තව ද මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි අභියාචනාධිකරණය විසින් එය භාරගෙන ඒ පිළිබඳව කටයුතු කළ යුතු අතර ඒ කොන්දේසි ඉටු කරනු නොලැබුවහොත් අභියාචනාධිකරණය විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය. අභියාචක විසින් ඒ පෙත්සම සමග වගඋත්තරකරු හෝ වගඋත්තරකරුවන් වෙත භාර දීම සඳහා අවශ්‍ය පිටපත් සංඛ්‍යාව ඉදිරිපත් කළ යුතු ය.

(2) අභියාචනය කිරීමට අවසර ලබාගැනීම සඳහා වූ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ විට අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලීමට අංකයක් යෙදිය යුතු අතර එම ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දින සිට දින තුනක් ඇතුළත ඒ ඉල්ලීම අභියාචනාධිකරණයේ සභාපතිවරයා වෙත හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් නම් කරන ලද විනිශ්චයකාරවරයකු වෙත හෝ ඔහුගේ පෞද්ගලික කාමරයේ දී ඉදිරිපත් කළ යුතු ය.

(3) අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබුවේ යම් විනිශ්චයකාරවරයකු වෙත ද ඒ විනිශ්චයකාරවරයා විසින්—

(අ) ඉල්ලීම විභාග කිරීම සඳහා දිනයක් වහාම නියම කිරීම සහ ඒ පිළිබඳ දැන්වීමක් වගඋත්තරකරු හෝ වගඋත්තරකරුවන් වෙත නිකුත් කරනු ලැබීමට ආඥාවක් කිරීම කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) ඒ විනිශ්චයකාරවරයා විසින් නියම කරනු ලබන දිනයක, පෙත්සම්කරුට හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයාට ඒ ඉල්ලීම විවෘත අධිකරණයේදී සනාථ කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය; තව ද අධිකරණය විසින් පෙත්සම්කරුට හෝ ඔහුගේ නීතිඥවරයාට සවන්දීමෙන් පසු ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. නැතහොත් ඉල්ලීම විභාග කිරීම සඳහා දිනයක් නියම කොට ඒ පිළිබඳ දැන්වීමක් වගඋත්තරකරු වෙත හෝ වගඋත්තරකරුවන් වෙත නිකුත් කරනු ලැබීමට ආඥා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක, එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු අධිකරණය විසින් වාර්තා ගත කළ යුතු ය.

(4) දැන්වීමක් නිකුත් කරන ලෙස ආඥාවක් කරන ලද අවස්ථාවක, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අනුව එක් එක් වගඋත්තරකරු හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු අතර, අභියාචක විසින් සපයන ලද අභියාචන පෙත්සමේ පිටපතක් ද එසේ නිකුත් කරනු ලබන දැන්වීමට ඇමිණිය යුතු ය. දැන්වීමේ සඳහන් දිනයෙහි හෝ අධිකරණය විසින් එවිට නියම කරනු ලබන වෙනත් යම් දිනයක හෝ අධිකරණය විසින් අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම විභාග කර, අභියාචනය කිරීමට අවසර දීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ කළ යුතු ය.

(5) අභියාචනය කිරීමට අවසර දෙනු ලැබූ විට, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, වහාම ඒ බව මුල් අධිකරණය වෙත දැනුම් දිය යුතු අතර, අභියාචනාධිකරණය විසින් අන්‍යාකාර විධාන යක් කරනු ලැබුවහොත් මිස, මුල් අධිකරණයේ එය පිළිබඳව සියලු නඩු කටයුතු නතර කළ යුතු ය. තව ද එකී අධිකරණය විසින් නඩුවෙහි විවාදපන්න කාරණයට අදාළ නඩුවේ සියලු ලියකියවිලි සහ නඩු කටයුතු වාර්තා හැකි ඉක්මණින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

අභියාචනයෙහි භාෂාව හා ආකෘතිය.

758. (1) අභියාචන පෙත්සම, හොඳ සහ සුදුසු කඩදාසියක පැහැදිලිව ලිවිය යුතු අතර, පහත දැක්වෙන විස්තර එහි ඇතුළත් විය යුතු ය:—

(අ) නඩුව විනිශ්චයට භාජනව පවත්නා අධිකරණයේ නම;

(ආ) නඩුවෙහි පාර්ශ්වකරුවන්ගේ නම්;

(ඇ) අභියාචකගේ සහ වගඋත්තරකරුගේ නම්;

(ඈ) අභියාචනාධිකරණය වෙත කරනු ලබන ආමන්ත්‍රණය;

(ඉ) අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට විරුද්ධව ද ඒ නඩු තීන්දුවට, තීන්දු ප්‍රකාශයට හෝ ආඥාවට විරුද්ධ වීමේ හේතු පිළිබඳ පැහැදිලි සංක්ෂිප්ත ප්‍රකාශයක්—ඒ ප්‍රකාශය යථා පරිදි අංක යොදනු ලැබූ ඡේදවලින් දැක්විය යුතු ය;

(ඊ) ඊළඟට පාන්නේ කවර ආකාරයක සහනය කට ද ඒ සහනය ඉල්ලා සිටීම.

අභියාචනය තීරණය කිරීමේ දී ඉල්ලුම්කරු විසින් දක්වා ඇති හේතුවලට පමණක් අධිකරණයේ සැලකිල්ල සීමා නොවිය යුතු බව.

(2) යම් අභියාචනයක් තීරණය කිරීමේ දී අභියාචක විසින් දැක්වූ හේතුවලට ම පමණක් අධිකරණයේ සැලකිල්ල සීමා නොවිය යුතු ය. එහෙත් අභියාචක විසින් නොදක්වන ලද හේතුවක් සම්බන්ධයෙන් වගඋත්තරකරුට කරුණු කියා සිටීමේ ප්‍රමාණවත් අවස්ථාවක් දෙනු ලැබ ඇත්නම් මිස, එවැනි හේතුවක් මත අධිකරණය විසින් ස්වකීය තීරණය පදනම් නොකළ යුතු ය.

පෙත්සම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු අවස්ථාව.

759 (1) ඉහතින් වූ වගන්තියෙහි දක්වා ඇති ආකාරයට අභියාචන පෙත්සම සකස් කොට නොතිබෙන්නේ නම්, එය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. නැතහොත් අධිකරණය විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත එය සංශෝධනය කිරීමේ කාර්යය සඳහා අභියාචක වෙත ආපසු එවනු ලැබිය හැකි ය. නැතහොත් ඒ අවස්ථාවේ දීම සහ එතැන දීම එය සංශෝධනය කරනු ලැබිය හැකි ය. අධිකරණය විසින් යම් අභියාචන පෙත්සමක් මේ වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ විට එලෙස ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු අධිකරණය විසින් වාර්තාගත කළ යුතු ය. තව ද මේ වගන්තිය යටතේ යම් අභියාචන පෙත්සමක් සංශෝධනය කරනු ලැබූ විට, විනිශ්චයකාරවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් පත් කරන ලද වෙනත් නිලධරයකු විසින් හෝ ඒ සංශෝධනය නම අත්සනින් සහතික කළ යුතු ය.

(2) (යම් ක්‍රියාවක් හෝ දෙයක් කරනු ලැබිය යුත්තේ යම් කාලසීමාවක් ඇතුළත ද, ඒ කාලසීමාව සඳහන් කරන විධිවිධානයක් නොවන්නා වූ) ඉහතින් වූ වගන්තිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමෙහි ලා යම් අභියාචකයකු අතින් යම් වැරදීමක්, නොකර හැරීමක් හෝ දෝෂයක් සිදුවී ඇති විට, එයින් වගඋත්තරකරුට සැලකිය යුතු හානියක් සිදුවී නොමැති බව අභියාචනාධිකරණයේ මතය වුවහොත්, ඒ අධිකරණය විසින් යුක්තිසහගත යයි සලකන නියමයන් මත සහන ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

වෙන් වෙන් පැමිණිලිකරුවන්ගෙන් හෝ විත්තිකරුවන්ගෙන් එක් අයකු විසින් මුළු තීන්දු ප්‍රකාශයට ම විරුද්ධව අභියාචනය කළ හැකි අවස්ථාව.

760. කඩුවක පැමිණිලිකරුවන් හෝ විත්තිකරුවන් හෝ එක් අයකුට වැඩි සංඛ්‍යාවක් සිටින විට සහ අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ද ඒ තීන්දු ප්‍රකාශය සියලුම පැමිණිලිකරුවන්ට හෝ සියලු ම විත්තිකරුවන්ට හෝ යම් පොදු හේතුවක් මත කර තිබෙන විට, පැමිණිලිකරුවන් හෝ විත්තිකරුවන් අතුරෙන් එක් අයකු විසින් මුළු තීන්දු ප්‍රකාශයට ම විරුද්ධව අභියාචනය කළ හැකි ය. තවද එවිට අවස්ථාවෝචිත පරිදි, සියලු ම පැමිණිලිකරුවන්ගේ හෝ විත්තිකරුවන්ගේ වාසියට අභියාචනාධිකරණය විසින් එම තීන්දු ප්‍රකාශය ප්‍රතිවර්තනය කළ හැකි ය. නැතහොත් සුළු වශයෙන් වෙනස් කළ හැකි ය.

අභියාචනයේ පාර්ශ්වකරුවකුගේ මරණය සිදුවීම හෝ තත්ත්වය වෙනස් වීම.

700අ. යම් සිවිල් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් සම්බන්ධ අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසු යම් අවස්ථාවක දී අභියාචනයේ පාර්ශ්වකරුවකුගේ මරණය සිදුවීම හෝ තත්ත්වය වෙනස්වීම නිසා නඩු වාර්තාව දෝෂ සහිත වන අවස්ථාවක, මියගිය හෝ තත්ත්වය වෙනස් වූ පාර්ශ්වකරු වෙනුවට හෝ ඊට අතිරේකව ආදේශ කිරීමට හෝ නඩු වාර්තාවේ ඇතුළත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය අනුව නිසි තැනැත්තා කවරකු ද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සාදන ලද රීතිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කළ හැකි අතර ඊට පසු ඒ තැනැත්තාගේ නම ඉහත කී ආකාරයට නඩු වාර්තාවෙහි ආදේශ කරනු ලැබූ හෝ ඇතුළත් කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 765 වන වගන්තිය සංශෝධනය කිරීම.

51. ප්‍රධාන ප්‍රඥප්තියේ 765 වන වගන්තියේ " 754 වන හා 756 වන වගන්තිවල " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 754 වන සහ 755 වන වගන්තිවල " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.

52. ප්‍රධාන ප්‍රඥප්තියේ 800 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් පරිච්ඡේද මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ පරිච්ඡේද ඒ ප්‍රඥප්තියේ LXVI වන පරිච්ඡේදය සහ LXVIඅ පරිච්ඡේදය වශයෙන් බලසහිත විය යුතුය :—

IXඅ වන කොටස

"චූලායචන අධිකරණ සඳහා විශේෂ කාර්ය පටිපාටිය

LXVI වන පරිච්ඡේදය

සාමාන්‍ය විධිවිධාන.

චූලායචන අධිකරණ සඳහා විධිවිධාන.

801. චූලායචන අධිකරණවල කාර්ය පටිපාටිය පිළිබඳව පහත දැක්වෙන විශේෂ විධිවිධාන, මෙහි මින් පෙර ඇතුළත් සාමාන්‍ය විධිවිධාන ප්‍රකාශිත ලෙස හෝ ව්‍යංග ලෙස ඒ අධිකරණවලට අදාළ වනතාක් දුරට පමණක් සීමා කරන ලෙස සහ පාලනය කරන ලෙස තේරුම් ගත යුතු ය. මේ පරිච්ඡේදයේ ඇතුළත් විශේෂ විධිවිධානවලට අනනුකූල නොවන කවර වූ විටක ඒ සාමාන්‍ය විධිවිධාන සියලු කාරණා සම්බන්ධයෙන් චූලායචන අධිකරණවලට අදාළ විය යුතු ය. එහෙත් එවැනි යම් අනනුකූලතාවක් ඇති අවස්ථාවක මෙහි ඇතුළත් විශේෂ විධිවිධාන අදාළ විය යුතුය.

## උත්තරවාද

පැමිණිල්ල සහ වෙනත් උත්තරවාද ඉදිරිපත් කිරීම.

802. (1) සරල හෝ සංක්ෂිප්ත භාෂාවෙන් ලියා යථා පරිදි අත්සන් කරන ලද ප්‍රකාශයක් පැමිණිලිකරු විසින් මූලාසනවන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ ප්‍රේෂණය කිරීමෙන් ඒ අධිකරණයෙහි නඩුවක් පවරනු ලැබිය හැකි ය. නැතහොත් පැමිණිලිකරු විසින් ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාට තම නඩුව වාචිකව ප්‍රකාශ කළ හැකි අතර ඒ විනිශ්චයකාරවරයා විසින් එය ලියා ගැනීමට සැලැස්විය යුතු අතර ඊට පැමිණිලිකරුගේ අත්සන ලබාගත යුතු ය. තව ද එසේ ලියා ගන්නා ලද ප්‍රකාශය හෝ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද හෝ ප්‍රේෂණය කරන ලද හෝ ප්‍රකාශය නඩුවේ පැමිණිල්ල ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මූලාසනවන අධිකරණවල උත්තරවාද පහත දැක්වෙන කරුණුවලට සීමා විය යුතු ය:—

(අ) පැමිණිලිකරුගේ පැමිණිල්ල ;

(ආ) විත්තිකරුගේ උත්තරය සහ හරස් ඉල්ලීම (ඇතොත්) ;

(ඇ) විත්තිකරුගේ හරස් ඉල්ලීමට පැමිණිලිකරුගේ උත්තරය.

එහෙත් හරස් ඉල්ලීමක් නොමැති වූ විටෙක උත්තරයට පසුව වැඩිදුර උත්තරවාද නොමැති විය යුතු ය.

පැමිණිල්ල අංක කළ යුතු බව.

803. පැමිණිල්ලෙහි හෝ පැමිණිල්ල වශයෙන් වූ ප්‍රකාශයෙහි එය ඉදිරිපත් කරනු ලැබූ පිළිවෙලට අධිකරණයේ අනුක්‍රමික අංකය සහ එය ඉදිරිපත් කරනු ලැබූ දිනයෙහි හා අවුරුද්දෙහි දාතම තිබිය යුතු ය. තව ද පාර්ශ්වකරුවන්ගේ නම් සහ පදිංචි ස්ථාන එහි සඳහන් කළ යුතු ය.

පැමිණිල්ලෙහි නඩු නිමිත්ත ප්‍රකාශ කළ යුතු බව.

804. නඩු නිමිත්ත සංයුක්ත වන සිද්ධීන් සරල සහ ඍජු ආකාරයෙන් පැමිණිල්ලෙන් ප්‍රකාශ කළ යුතු ය.

කවර නඩු නිමිති එක් කළ හැකි ද යන බව.

805. නඩු නිමිති දෙකක් හෝ වැඩි ගණනක්—

(අ) නඩුවේ විෂයයට ම සම්බන්ධ ගණුදෙනුවකින් හෝ ගණුදෙනුවලින් උද්ගත වන්නා වූ ; හෝ

(ආ) ප්‍රකාශිත හෝ ව්‍යංග ගිවිසුමකින් උද්ගත වන්නා වූ

විට පැමිණිලිකරු විසින් එකම පැමිණිල්ලක ඒ නඩු නිමිති එක් කළ හැකි ය :

එසේ වුව ද, එසේ එක් කළ සියලු නඩු නිමිති එක් එක් නඩු නිමිත්තට අනුකූල වන බවට, එකම වර්ගයක සහනයක් ලැබීමට පැමිණිලිකරුට ඒවායින් හිමිකම ලැබෙන බවට සහ සියලු පාර්ශ්වකරුවන් කෙරෙහි ම ඒවා බලපාන බවට පැමිණිල්ලෙහි මතුපිටින් පෙනී යා යුතු ය.

සිතාසි නිකුත් කළ යුතු බව.

806. ඉහත කී පරිදි ඒ පැමිණිල්ල හෝ ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබූ විට අධිකරණය විසින්, ඒ මත කරනු ලබන සටහනක් මගින් විත්තිකරුගේ පැමිණ සිටීම සඳහා දිනයක් නියම කළ යුතු අතර ඒ දිනය අධිකරණයෙහි නඩුව පැවරීමේ දින සිට මාස තුනක් පසු නොවන දිනයක් විය යුතු ය. තව ද ඒ බව පැමිණිලිකරුට හෝ ඔහුගේ නීතිඥවරයාට දැනුම් දිය යුතු ය ; තව ද පාර්ශ්වකරුවන්ගේ නම් සහ පදිංචි ස්ථාන, හිමිකම්පෑමේ හරය සහ නඩුවේ අංකය සඳහන් කරමින් විත්තිකරුගේ පැමිණ සිටීම සඳහා සිතාසියක් ද නිකුත් කළ යුතු ය. එවැනි සෑම සිතාසියක් ම පළමුවන උපලේඛනයේ 16 වන ආකෘතිය අනුව විය යුතු ය.

## සිතාසි

සිතාසි යැවීම පිළිබඳව.

807. මූලායතන අධිකරණයකින් නිකුත් කරනු ලැබූ සියලුම සිතාසි, ආඥා සහ වෙනත් කැඳවීම් නියෝග අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර, ඒවා භාරදීම හෝ ක්‍රියාවේ යෙදවීම සඳහා ශ්‍රී ලංකාව ඇතුළත යම් පිස්කල්වරයකු වෙත යැවිය යුතු ය :

එසේ වුව ද (ක්‍රියාවේ යෙදවීමේ සහ සන්තකය පිළිබඳව රිට් ආඥා හැර) යම් සිතාසියක්, ආඥාවක් හෝ කැඳවීම් නියෝගයක් භාර කරවීම පිස්කල්වරයකුට යැවීමෙන් හැර අන්‍යාකාරයකින් වඩා පහසු ලෙස හෝ වඩා කඩිනමින් භාර කරවීමට හැකි බව අධිකරණයට පෙන්නුම් කරවනු ලැබූ අවස්ථාවක, එවැනි සිතාසියක්, ආඥාවක් හෝ කැඳවීම් නියෝගයක් මත පිටසන් කිරීමෙන් එහි නම් කරනු ලැබූ යම් තැනැත්තකු මගින් අධිකරණය විසින් එය භාර කරවීම නීත්‍යානුකූල වන්නේ ය :

එසේම තවදුරටත් ඉහත සඳහන් පරිදි විත්තිකරු වෙත සිතාසි භාරදීම තම පාලනයෙන් බැහැර වූ අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන අධිකරණයේ පිස්කල්වරයා පැහැර හරින අවස්ථාවක, සිතාසි ආපසු භාරදීම සඳහා නියම කරන ලද කාලය, පැමිණිල්ලට උත්තරදීමට විත්තිකරුට පළමුවෙන් නියම කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දින සිට මාස තුනකට පසු නොවන දිනයකට අධිකරණය විසින් ස්වකීය අභිමතය අනුව දීර්ඝ කළ හැකි ය.

සිතාසි භාරදීම පිළිබඳව.

808. මේ ආඥාපනතේ 59 වන වගන්තියේ සිට 71 වන වගන්තිය තෙක් ඒ වගන්ති දෙකම ඇතුළුව සියලු වගන්ති ද XXIII වන පරිච්ඡේදය ද ඉහතින් ම වූ වගන්තියෙහි ඇතුළත් විධිවිධාන වලට අනනුකූල නොවනතාක් දුරට චූලායවන අධිකරණවල සිතාසි භාරදීම, ආපසු භාරදීම සහ සිතාසි භාරදීම ඔප්පු කිරීම පිළිබඳව අදාළ විය යුතු ය.

## පෙනී සිටීමෙන් පසු නඩු කටයුතු

විත්තිකරු පෙනී සිට හිමිකම් පෑම පිළිගත යුතු බව හෝ ප්‍රතික්ෂේප කළ යුතු බව.

809. (1) සිතාසියේ සඳහන් කරනු ලැබූ ස්ථානයේ සහ දිනයෙහි පැමිණිලිකරුගේ හිමිකම් පෑම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට විත්තිකරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(2) විත්තිකරු විසින් හිමිකම්පෑම පිළිගනු ලැබුව හොත්, අධිකරණය විසින්, ඒ පිළිගැනීම පළමුවන උපලේඛනයේ 135 වන ආකෘතිය අනුව නඩු වාර්තාවෙහි සටහන් කළ යුතු ය. තව ද එය අත්සන් කිරීමට විත්තිකරුට නියම කළ යුතු අතර පැමිණිලිකරුගේ වාසියට නඩු තීන්දුව සටහන් කළ යුතු ය:

එසේ වුවද, පහසුවෙන් අධිකරණයට පැමිණ සිටීමට නොහැකි විත්තිකරුවකු විසින්, තමා හඳුනන නීතිඥවරයකු ඉදිරියේ හා ඔහුගේ සහතික කිරීම යටතේ තමා විසින් අත්සන් කරනු ලැබූ තම පිළිගැනීම රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. තව ද ඒ පිළිගැනීම භාර ගෙන සටහන් කිරීමෙන් පසු අධිකරණය විසින් ඒ අනුව පැමිණිලිකරුගේ වාසියට නඩු තීන්දුව සටහන් කළ යුතු ය.

(3) විත්තිකරු විසින් හිමිකම්පෑම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එය එකෙනෙහිම හෝ, හේතු දැක්වූ විට අධිකරණය විසින් ඉඩ දෙනු ලබන යම් කාලයක් ඇතුළත, උත්තරවාද ඉදිරිපත් කිරීමට

ඔහුට නියම කළ යුතු ය. තව ද ඔහු විසින් තම විත්තිවාචකය අධිකරණය වෙත වාචිකව ඉදිරිපත් කළ විට අධිකරණය විසින් එය ලියවිල්ලක් බවට පත් කොට, විත්තිකරුගේ අත්සන ඊට ලබාගත යුතු ය. නැතහොත් 73 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි තම විත්තිවාචකය දැක්වෙන ඔහුගේ උත්තරයක් සහ පැමිණිලිකරුට විරුද්ධව ඔහුට තිබිය හැකි යම් හරස් ඉල්ලීමක් ලියවිල්ලකින් රෙජිස්ට්‍රාර්වරයාට භාර දිය යුතු ය. ඒ උත්තරය විත්තිකරු විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි මුද්‍රා තබා දිනය යොදා නොපමාව එය නඩු වාර්තාවෙහි ගොනු කළ යුතු ය.

පාර්ශ්ව කරුවන් විභාග කිරීම.

**810.** පාර්ශ්වකරුවන් අතර විසඳිය යුතු කරුණු නිර්ණය කර ගැනීමේ හා අනවශ්‍ය සාක්ෂි බැහැර කිරීමේ අරමුණෙන් ඇතිව නඩු කටයුතුවල කවර හෝ අවස්ථාවක දී අධිකරණය විසින් පාර්ශ්වකරුවන් විභාග කරනු ලැබිය හැකි ය.

හරස් ඉල්ලීම් පිළිබඳව.

811. විත්තිකරු විසින්, තම උත්තරය සමග හරස් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, එය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටිය යුතු ය. හරස් ඉල්ලීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එකෙනෙහිම හෝ අධිකරණය විසින් නියම කරනු ලබන යම් වෙනත් වේලාවක උත්තරවාද ඉදිරිපත් කිරීමට පැමිණිලිකරුට නියම කළ යුතු අතර 809 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන විත්තිකරුගේ හරස් ඉල්ලීම සම්බන්ධයෙන් වූ පැමිණිලිකරුගේ උත්තරයට අදාළ වනතාක් දුරට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය :

එසේ වුව ද තම මුල් පැමිණිල්ලෙන් උත්තරවාද ඉදිරිපත් කරනු ලැබීමට හැකි වූ අලුත් නඩු නිමිත්තක් වන අලුත් කරුණු කිසිවක් තම උත්තරයෙන් පැමිණිලිකරු විසින් කිසිම අවස්ථාවක දැක්වීම නොකළ යුතු ය.

පිළිගැනීම සටහන් කිරීම පිළිබඳව.

812. පැමිණිලිකරු විසින් හරස් ඉල්ලීම පිළිගනු ලැබුවහොත්, අධිකරණය විසින් ඒ පිළිගැනීම නඩු වාර්තාවෙහි සටහන් කළ යුතු අතර එය අත්සන් කිරීමට පැමිණිලිකරුට නියම කළ යුතු ය.

## උත්තරවාදවලට අදාළ විවිධ විධිවිධාන

ගිණුම් මත හෝ මුදල් ගෙවීම සඳහා වූ සාධන පත්‍රයක් මත පවරනු ලබන නඩු.

**813.** ගිණුමක් මත හෝ මුදල් පමණක් ගෙවීම සඳහා වූ සාධන පත්‍රයක් මත නඩු නිමිත්තක් හෝ හරස් ඉල්ලීමක් දැක්වීමේ කාර්යය සඳහා, පාර්ශ්වකරු විසින් සාධන පත්‍රය හෝ ගිණුමේ පිට පතක් අධිකරණය වෙත භාර දී අයකර ගැනීමට හෝ හිලව් කිරීමට තමා හිමිකම් පා සිටින යම් නිශ්චිත මුදලක් ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයෙන් ඒ මත තමාට ලැබිය යුතු බව ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

නොවැදගත් වෙනසක් සැලකිය යුතු නැති බව.

**814.** උත්තරවාදයක ඇතුළත් කියා පෑමක් සහ ඔප්පු කිරීම අතර වෙනසක්, ඒ ඔප්පු කිරීමෙන් අලුත් නඩු නිමිත්තක් අනාවරණය වන්නේ නම් හෝ එමගින් තමාට අහිතකර වන ආකාරයෙන් ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය නොමඟ ගොස් ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස, නොවැදගත් වෙනසක් ලෙස සැලකිල්ලට නොගත යුතු ය.

උත්තරවාදය සංශෝධනය කිරීම.

815. මූලායවන අධිකරණවල උත්තරවාද සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 93 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

හරස් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට නොසැලකිලිමත් වීමේ ප්‍රතිඵලය.

816. යම් නඩුවක දී විත්තිකරු ඒ නඩුවේ නඩු විභාගයේ දී තමාට දෙනු ලැබිය හැකි ඒ හා සමාන නිමිත්තක් සඳහා තම වාසියට වූ නඩු නිමිත්තක්, හරස් ඉල්ලීමක් මගින් ඉදිරිපත් කිරීමට සැලකිලිමත් නොවන අවස්ථාවක, ඔහු ද ඔහු මගින් හෝ ඔහුගෙන් ඊට හිමිකම් ව්‍යුත්පන්න වූ සෑම තැනැත්තකු ද එය ලබා ගැනීම සඳහා නඩුවක් පවත්වා ගෙන යාමෙන් ඉන් මතු සදහට ම වළක්වනු ලබයි.

816 වන වගන්තිය අදාළ නොවන අවස්ථා.

817. ඉහතින් වූ වගන්තියෙහි ඇතුළත් නගනම පහත දැක්වෙන අවස්ථාවලට අදාළ නොවේ:—

(අ) හරස් ඉල්ලීමේ මුදල් ප්‍රමාණය අධිකරණයේ මූල්‍ය අධිකරණ බලය ඉක්ම වන අවස්ථාවක;

(ආ) හරස් ඉල්ලීම ඉදිරිපත් කළ හැකිව තිබූ නඩුවේ ආරම්භයට පෙර දෙනු ලැබූ නඩු තීන්දුවක හරස් ඉල්ලීම සමන්විත වී ඇති අවස්ථාවක;

(ඇ) හරස් ඉල්ලීම ප්‍රමාණ නොකළ අලාභ සඳහා වන අවස්ථාවක ;

(ඈ) නඩුව ආරම්භ කළ අවස්ථාවේ දී විනිශ්චය යට භාජනය වෙමින් පවත්නා වෙනත් නඩුවක හිමිකම් පෑමක් මත හරස් ඉල්ලීම සමන්විත වන අවස්ථාවක ;

(ඉ) විත්තිකරු වෙත සිතාසි පෞද්ගලිකව භාර දීමක් හෝ ඔහුගේ පෙනී සිටීමක් නොමැතිව ඔහුට විරුද්ධව නඩු තීන්දුව ලැබුණු අවස්ථාවක.

සම්බන්ධ ඉල්ලීමක් හරස් යෙන් නඩු තීන්දුව.

818. පැමිණිලිකරුගේ හිමිකම් පෑමට සමාන වූ හරස් ඉල්ලීමක් තහවුරු කරනු ලැබූ විට, නඩු තීන්දුව විත්තිකරුගේ වාසියකට විය යුතු ය. එය පැමිණිලිකරුගේ හිමිකම් පෑමට වඩා අඩු වන අවස්ථාවක ශේෂය සඳහා පමණක් පැමිණිලිකරුට නඩු තීන්දුව ලැබිය යුතු ය. එය පැමිණිලිකරුගේ හිමිකම් පෑම ඉක්මවන අවස්ථාවක අතිරික්තය සඳහා හෝ පැමිණිලිකරුගෙන් අය විය යුතු ප්‍රමාණයට විත්තිකරුට නඩු තීන්දුව දිය යුතු ය.

### නඩු විභාග කරන දිනය නියම කිරීම

නඩුව විභාගය සඳහා නියම කිරීම.

819. (1) 809 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි විත්තිකරුගේ වාර්ෂික විත්තිවාචකය වාර්තා ගත කරනු ලැබීමෙන් හෝ ඔහුගේ ලිඛිත උත්තරය භාර ගනු ලැබීමෙන් ඉක්බිතිව ම නැතහොත් හරස් ඉල්ලීමක් ඇති අවස්ථාවක 811 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි උත්තරවාද ඉදිරිපත් කරනු ලැබූ ඉක්බිතිව ම, අධිකරණය විසින් නඩුව විභාග කිරීම සඳහා දිනයක් නියම කළ යුතු අතර ඒ පිළිබඳව වාර්තාවක් නඩු වාර්තාවෙහි සටහන් කළ යුතු ය. තව ද නඩු විභාගය සඳහා නියම කරන ලද සියලු නඩු රෙජිස්ට්‍රාර්වරයා විසින් තත් කාර්යය සඳහා තබනු ලබන නඩු ලැයිස්තුවෙහි නිසි පිළිවෙලට ඇතුළත් කළ යුතු අතර ඒවා එසේ සටහන් කරනු ලැබුවේ යම් පිළිවෙලකට ද ඒ පිළිවෙල අනුව නඩු විභාගය සඳහා ගනු ලැබිය යුතු ය :

එසේ වුව ද හේතු දක්වනු ලැබූ විට යම් නඩුවක් වාරයෙන් පිට ගැනීමට හා එය විභාග කිරීමට අධිකරණයට නිසි බලය ඇත්තේ ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද දිනයේ දී විසඳිය යුතු සිද්ධීන් පිළිබඳව හෝ නඩු විභාගයේදී ඉදිරිපත් කරනු ලැබිය යුතු යම් ලේඛනයක නිවැරදි භාවය පිළිබඳව යම් පිළිගැනීම් වේනොත් අධිකරණය විසින් ඒවා වාර්තා ගත කළ යුතු අතර විසඳිය යුතු ප්‍රශ්න තීරණය කිරීමට කටයුතු කළ යුතු ය.

සාක්ෂිකරුවන් පිළිබඳ ලැයිස්තුව.

(3) නඩු විභාගය සඳහා දිනය නියම කරනු ලැබූ වහාම පාර්ශ්වකරුවන් විසින්, තම සාක්ෂිකරුවන් පිළිබඳව සහ නඩු විභාගයේ දී සාක්ෂි වශයෙන් මෙහෙයවීමට නමා යෝජනා කරන ලේඛන පිළිබඳව ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු ය. තව ද යම් සාක්ෂිකරුවකුගේ නාම සහ යම් ලේඛනයක විස්තරය ඒ ලැයිස්තුවෙහි දැක්වෙන්නේ නම් මිස අධිකරණයේ අවසරය නොමැතිව නඩු විභාගයේ දී එවැනි සාක්ෂිකරුවකු විභාග නොකළ යුතු අතර එවැනි ලේඛනයක් සාක්ෂි වශයෙන් භාර ගනු නොලැබිය යුතු ය.

## අඩාලව කල් තැබීම්

අඩාලව කල් තැබීම්.

820. චූලායවන අධිකරණවල අඩාලව කල් තැබීම් සම්බන්ධයෙන් ආඥාපනතේ 143 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

අඩාලව කල් තැබීමක දී සාක්ෂිකරුවන් විභාග කිරීමට අධිකරණය විසින් ආඥා කළ හැකි බව.

821. අඩාලව කල් තැබීමක් සඳහා වූ ඉල්ලීමක් ප්‍රදානය කරනු ලැබීම මත අධිකරණය විසින්, පැමිණ සිටින යම් සාක්ෂිකරුවකු විභාග කළ යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය. එසේ විභාග කරනු ලැබූ සාක්ෂිකරුවකුගේ සාක්ෂිය වාර්තා ගත කරනු ලැබිය යුතු අතර එය ඒ සාක්ෂිකරුගේ සාක්ෂිය මෙන් නඩු විභාගයේ දී කියවනු ලැබිය හැකි ය.

## පැමිණ සිටීම පැහැර හැරීම

පැමිණිලිකරු පැමිණ සිටීම පැහැර හැරිය විටකදී නඩු කටයුතු.

822. (1) සිතාසියෙහි සඳහන් දින හෝ 807 වන වගන්තිය යටතේ උත්තරය ඉදිරිපත් කිරීම කල් තබනු ලැබුවේ යම් දිනකට ද ඒ දිනයෙහි හෝ නඩුව විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ යම් දිනයක පැමිණිලිකරු පැමිණ නොසිටියහොත් නැතහොත් ඔහුගේ නොපැමිණීම පිළිබඳ ප්‍රමාණවත් ලෙස නිදහසට හේතු ඉදිරිපත් කරනු නොලැබුවහොත්, පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද 809 වන වගන්තිය යටතේ ඉල්ලා සිටි විට විත්තිකරු විසින් පැමිණිලිකරුගේ හිමිකම් පෑම පිළිගනු ලැබුවහොත්, අධිකරණය විසින් නීතිය අනුව පැමිණිලිකරුගේ වාසියට නඩු තීන්දුව සටහන් කළ යුතු ය.

**විත්තිකරු පැමිණ සිටීම පැහැර හැරී විට.**

(2) සිතාසියෙහි සඳහන් දින හෝ 807 වන වගන්තිය යටතේ උත්තරය ඉදිරිපත් කිරීම කල් තබනු ලැබුවේ යම් දිනකට ද ඒ දිනයෙහි හෝ නඩු විභාගය සඳහා නියම කරනු ලැබූ යම් දිනයක විත්තිකරු පැමිණ නොසිටියහොත් නැත හොත් ඔහුගේ නොපැමිණීම පිළිබඳ ප්‍රමාණවත් ලෙස නිදහසට හේතු ඉදිරිපත් කරනු නොලැබුවහොත් හෝ ඒ පැමිණ සිටීම නියම කරන සිතාසිය, දැන්වීම හෝ ආඥාව භාර දෙනු ලැබූ බව යථා පරිදි ඔප්පු කරනු ලැබූ විට, විත්තිකරුට විරුද්ධව පැමිණ සිටීම පැහැර හැරීමේ නඩු තීන්දුවක් අධිකරණය විසින් සටහන් කළ හැකි ය:

එසේ වුව ද ඉඩමක සන්නකය සම්බන්ධයෙන් හිමිකම හෝ එහි සම්බන්ධතාවයට හෝ අයිතිවාසිකමක් පිළිබඳව විවාදයක් ඇති වූ සියලු අවස්ථාවල දී සහ පැමිණිලිකරුගේ හිමිකම් පෑම සනාථ කිරීමෙහිලා සාක්ෂි විභාග කිරීම අවශ්‍ය යයි හෝ අවශ්‍යානුකූල යයි අධිකරණය විසින් සලකනු ලබන වෙනත් යම් අවස්ථාවක දී, නත් කාර්යය සඳහා නියම කරනු ලබන යම් දිනයකදී ඒ සාක්ෂි ඉදිරිපත් කිරීමට විනිශ්චයකාරවරයා විසින් පැමිණිලිකරුට අණ කළ යුතු ය. තව ද ඒ සාක්ෂි විභාග කිරීමෙන් පසුව, යුක්ති ධර්මය නියම කරන පරිදි එහි සාරාර්ථය මත සහ කරනු ලැබූ පැහැර හැරීම ගෙරෙහි සඳහනක් නොමැතිව නඩු තීන්දුව අධිකරණය විසින් දිය යුතු ය.

**පැහැර හැරීම සම්බන්ධයෙන් දෙනු ලැබූ නඩු තීන්දු ඇතැම් අවස්ථාවල දී නැවත විභාග කළ හැකි බව.**

(3) නඩු තීන්දුවෙන් හෝ ආඥුවෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත, තමාට නිසි වේලාවෙහි පෙනී සිටීම වළක්වනු ලැබුවේ අහඹුවකින් අවාසනාවකින් හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවකින් බව නැතහොත් නඩු කටයුතු පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු නොලැබීමෙන් බව සහ තමා පැමිණ නොසිටියේ සිතාසි හෝ දැන්වීම් හැර ගැනීම වැළැක්වීමේ කාර්යය සඳහා නොවන බවත් නඩුවෙහි සාරාර්ථය මත තමාට හොඳ හා වලංගු විත්ති වාචකයක් ඇති බව විත්තිකරු විසින් දිවුරුම් පත්‍රයකින් හෝ අන්‍යාකාරයකින් අධිකරණය සෑහීමට පත් කළ හොත්, එවිට අධිකරණය විසින් ඒ නඩු තීන්දුව හෝ ආඥාව සහ ඒ පිළිබඳව පවත්වනු ලැබූ යම් නඩු කටයුතු අධිකරණය විසින් ඉවත දමනු හැකි ය.

තවද අධිකරණයට සුදුසු යයි හැඟෙන නියමයන් මත සහ පැමිණිලිකරුට දන්වනු ලැබීමෙන් පසු විත්තිකරුට තම විත්තිය වාචිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කර ගෙන යාමට ඉඩ දිය හැකි ය.

එක් පාර්ශ්වයක්වත් පැමිණ නොසිටිය හොත් නඩුව නිෂ්ප්‍රභ කළ යුතු බව.

(4) සිතාසියෙහි සඳහන් දින හෝ 807 වන වගන්තිය යටතේ උත්තරය ඉදිරිපත් කිරීම කල් තබනු ලැබුවේ යම් දිනයකට ද ඒ දිනයෙහි හෝ නඩු විභාගය සඳහා නියම කරනු ලැබූ යම් දිනයක, නඩුව අඩ ගසනු ලැබූ විට එක් පාර්ශ්වයක්වත් පැමිණ නොසිටියහොත්, අධිකරණය විසින් පැමිණිලිකරුගේ නඩුව ගාස්තු නොමැතිව නිෂ්ප්‍රභ කරමින් නඩු තීන්දුව සටහන් කළ යුතු ය.

අලුත් නඩුවක් පැවරීමට පැමිණිලිකරුට අවසර දිය හැකි බව.

(5) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නඩුවක් නිෂ්ප්‍රභ කරනු ලැබ ඇති විට සහ තමාගේ පෙනී සිටීම වළක්වනු ලැබුවේ අහඹුවකින්, අවාසනාවකින් හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවකින් බව දිවුරුම් පත්‍රයකින් හෝ අන්‍යාකාරයකින් පැමිණිලිකරු විසින් අධිකරණය සෑහීමට පත් කර ඇති විට, විත්තිකරුට දැන්වීමක් ඇතිව නිෂ්ප්‍රභ කිරීමේ ආඥාව ඉවත් කොට සුදුසු යයි අධිකරණය විසින් සල්පනා කරනු ලබන යම් නියමයක් මත නඩුව සම්බන්ධයෙන් කටයුතු කරගෙන යා හැකිය ; නැතහොත් කලින් නඩුවේ ගාස්තු වශයෙන් විත්තිකරුට අයවිය යුතු යම් මුදලක් වේනොත් ඒ මුදල අධිකරණයට ගෙවීමෙන් පසු අලුත් නඩුවක් පැවරීමට අධිකරණය විසින් පැමිණිලිකරුට අවසර දිය හැකි ය.

පෙනී සිටීම පැහැර හැරීම සම්බන්ධයෙන් වූ නඩු තීන්දුවට විරුද්ධව අභියාචනයක් කළ නොහැකි බව.

(6) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතෙහි හෝ මේ සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, පැමිණ සිටීම පැහැර හැරීම සඳහා මේ වගන්තිය යටතේ සටහන් කරන ලද යම් නඩු තීන්දුවකට විරුද්ධව අභියාචනයක් කරනු නොලැබිය යුතු ය.

84 වන වගන්තියේ සිට 88 වන වගන්තිය දක්වා වූ වගන්ති ප්‍රාථමික අධිකරණ වලට අදාළ නොවිය යුතු බව.

(7) 84 වන වගන්තියේ සිට 88 වන වගන්තිය දක්වා වූ වගන්ති ඒ වගන්ති දෙකම ඇතුළුව ප්‍රාථමික අධිකරණවල නඩු කටයුතුවලට අදාළ නොවිය යුතු ය.

## විචාරණ

94 වන වගන්තියේ සිට 100 වන වගන්ති දක්වා වූ වගන්ති චූලායවන අධිකරණ වලට අදාළ නොවිය යුතු ය.

823. 94 වන වගන්තියේ සිට 100 වන වගන්තිය දක්වා වූ වගන්ති, ඒ වගන්ති දෙකම ඇතුළුව චූලායවන අධිකරණවල නඩු කටයුතුවලට අදාළ නොවිය යුතු ය.

## සාක්ෂිකරුවන් පැමිණ සිටීම

සාක්ෂිකරුවන් පැමිණ සිටීම.

824. සාක්ෂිකරුවන් පැමිණ සිටීම බල කරවීම සඳහා චූලායවන අධිකරණවල කැඳවීම් නියෝග තම සන්තකයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන ඉදිරිපත් කිරීමට නියම කෙරෙන නියමයක් ඇතිව හෝ නොමැතිව සිතාසි මගින් විය යුතුය. එවැනි සෑම සිතාසියක් ම පළමුවන උපලේඛනයේ අංක 136 දරන ආකෘතියට සාරානුකූල විය යුතු ය.

121 වන වගන්තිය හැර XVII වන පරිච්ඡේදය චූලායවන අධිකරණවලට අදාළ විය යුතු බව.

825. 121 වන වගන්තිය හැර මේ ආඥාපනතේ XVII වන පරිච්ඡේදයේ විධිවිධාන චූලායවන අධිකරණවල නඩු කටයුතුවලට අදාළ විය යුතු ය.

## නඩු විභාගය

නඩු විභාගය.

826. නඩු විභාග දිනයෙහි විනිශ්චයකාරවරයා විසින් නීතියට අනුකූලව නඩුව විභාග කොට තීරණය කළ යුතු ය.

නඩු කටයුතු පිළිබඳ වාර්තාව.

827. පාර්ශ්වකරුවන් විභාග කිරීම, සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සහ නඩුවේ වෙනත් සියලු කටයුතු පිළිබඳව සම්පූර්ණ වූ ද නොඅඩු වූ ද වාර්තාවක් තැබිය යුතු ය.

XIX වන පරිච්ඡේදය චූලායවන අධිකරණ වලට අදාළ කිරීමේ ප්‍රමාණය.

828. මේ ආඥාපනතේ XIX වන පරිච්ඡේදයේ විධිවිධාන, මේ පරිච්ඡේදයේ අඩංගු විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, චූලායවන අධිකරණ වලට අදාළ විය යුතු ය.

ප්‍රමාණ කළ ඉල්ලීම් පිළිබඳව ලඝු කාර්ය පටිපාටිය අනුව නඩු පැවරීම.

829. (1) යම් නඩුවක දී හිමිකම්පෑම විනිමය බිල්පත්‍රයක්, පොරොන්දු නෝට්ටුවක් හෝ චෙක්පතක් හෝ සාධන පත්‍රයක් නැතහොත් ප්‍රමාණ කළ මුදල් ප්‍රමාණයක් සඳහා ලියවිල්ලකින් වූ ගිවිසුමක් මත උද්ගතවන ණයක් හෝ මුදලින් වූ ප්‍රමාණ කළ ඉල්

ලිමක් සඳහා වූ විට නැතහොත් ඒ ණය හෝ ප්‍රමාණ කළ ඉල්ලීම්, විනිමය බිල් පත්‍රය පොරොන්දු නෝට්ටුව හෝ චෙක් පත සම්බන්ධයෙන් ප්‍රධානයාට විරුද්ධව ඇති හිමිකම් පෑම් ඇපයක් මත වූ විට ඒ ඇපය මත හෝ උද්ගත වන ණයක් හෝ මුදලින් වූ ප්‍රමාණ කළ ඉල්ලීමක් සඳහා වූ විට, පැමිණිලිකරු ලඝු කාර්ය පටිපාටිය අනුව කටයුතු කරගෙන යාමට කැමති නම් ඔහු විසින් මේ ආඥා පනතේ LIII වන පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ඒ නඩුව පවරනු ලැබිය හැකි ය. තව ද 710 වන වගන්තිය හැර, එම පරිච්ඡේදයේ විධිවිධාන එවැනි යම් නඩුවක කාර්ය සඳහා චූලායචන අධිකරණවල නඩු කටයුතුවලට අදාළ විය යුතු ය.

අනුව කිරීමේ වගන්තිය. (2) මේ ආඥාපනතේ LIII වන පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එවැනි යම් නඩුවක කාර්ය පටිපාටිය මේ පරිච්ඡේදය යටතේ පවරන ලද නඩුවල කාර්ය පටිපාටියම විය යුතු ය.

183අ වන වගන්තියේ විධිවිධාන ව්‍යාප්ත කිරීම. (3) නඩුවක පාර්ශ්වකරුවන්ගේ දිවුරුම් පත්‍ර සම්බන්ධයෙන් ආඥාපනතේ 183අ වන වගන්තියේ විධිවිධාන චූලායචන අධිකරණයක ඉදිරිපත් කරන ලද දිවුරුම් පත්‍රවලට ද අදාළ විය යුතු ය.

### නඩු තීන්දුව

නඩු තීන්දු සහ තීන්දු ප්‍රකාශ. **830.** චූලායචන අධිකරණවල නඩු තීන්දු, නඩු වාර්තාවෙහි ලියනු ලැබ විනිශ්චයකාරවරයා විසින් අත්සන් කරනු ලැබ, විවෘත අධිකරණයේ දී ප්‍රකාශයට පත් කළ යුතු ය. තව ද මේ ආඥාපනතේ XX වන පරිච්ඡේදයේ විධිවිධාන, මේ පරිච්ඡේදයේ ඇතුළත් විධිවිධානවලට අනානුකූල නොවන තාක් දුරට, චූලායචන අධිකරණවලට අදාළ විය යුතු ය.

අභියාචනය සහ අභියාචනය දක්වා ක්‍රියාවේ යෙදවීම නතර කිරීම. **831.** අභියාචන සහ අභියාචනය දක්වා ක්‍රියාවේ යෙදවීම නතර කිරීම සම්බන්ධයෙන් LVIII, LIX, LX, LXI සහ LXII වන පරිච්ඡේදවල විධිවිධාන මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනානුකූල නොවන තාක් දුරට, චූලායචන අධිකරණවලට අදාළ විය යුතු ය.

### ක්‍රියාවේ යෙදවීම්

ක්‍රියාවේ යෙදවීම්. **832.** (1) මේ ආඥාපනතේ XXII වන පරිච්ඡේදයේ විධිවිධාන, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනානුකූල නොවන තාක් දුරට, චූලායචන අධිකරණවල සියලු ක්‍රියාවේ යෙදවීම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා උපලබ්ධ වූ මුදල්, වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ මුදලට යම් හිමිකම් පෑමක් කරන බවට දැන්වීමක් අධිකරණය වෙත ලැබී නොමැති නම්, තීන්දු ප්‍රකාශය දරන්නා විසින් කරනු ලබන ඒකපාක්ෂික ඉල්ලීම මත ඔහුට ගෙවිය යුතු ය.

### ගාස්තු තක්සේරු කිරීම සහ මුද්දර ගාස්තු

ගාස්තු තක්සේරු කිරීම සහ මුද්දර ගාස්තු.

833. (1) ඉහත කී පරිදි ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් නිකුත් කිරීමට පෙර, ඒ රිට් ආඥාව ඉල්ලුම් කරන පාර්ශ්වකරුගේ ඉල්ලීම පිට රෙජිස්ට්‍රාර්වරයා විසින් විරුද්ධ පාර්ශ්වකරුව එරෙහිව නඩුවෙහි ගාස්තු සහ වියදම් වගාම තක්සේරු කළ යුතු ය. තව ද, ඒ තක්සේරුව සහ එමගින් ඉඩ දෙනු ලැබූ මුදල් පිළිබඳව සටහන් නඩු වාර්තාවෙහි ඇතුළත් කළ යුතු ය. තව ද ඒ ගාස්තු සහ වියදම් සියලු අවස්ථාවල දී මේ පනතේ 2 වන උපලේඛනයේ IV වන කොටසේ සඳහන් අනුප්‍රමාණවලට අනුකූලව තක්සේරු කරනු ලැබීම සහ ගෙවනු ලැබීම කළ යුතු ය.

(2) ප්‍රාථමික අධිකරණවල සියලු නඩු කටයුතු 1983 අංක 42 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන යටතේ මුද්දර ගාස්තු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

### අභියාචන

අභියාචන.

833අ. (1) ණයක්, අලාභයක් හෝ ඉල්ලීමක් සඳහා වූ යම් නඩුවක දී ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවකට හෝ අවසාන නඩු තීන්දුවක ප්‍රතිඵලය ඇත්තා වූ යම් ආඥාවකට විරුද්ධව නීතිය පිළිබඳ කාරණයක් මත හෝ සාක්ෂි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම මත හෝ අධිකරණයේ අවසරය ඇතිව මිස, අභියාචනයක් කරනු නොලැබිය යුතු ය.

(2) විනිශ්චයකාරවරයා විසින් අභියාචනය කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට දින හතක් ඇතුළත අභියාචනය කිරීමේ අවසරය සඳහා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන පෙත්සමක ආකාරයෙන් ලිඛිත ඉල්ලීමක් අතෘප්තියට පත් පාර්ශ්වකරු විසින් ප්‍රාථමික අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. නඩුවේ සියලු

ලේඛන සහ නඩු කටයුතු සහ අභියාචනය කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම සඳහා කරුණු සහ හේතු පිළිබඳ වාර්තාවක් සමග ඒ ඉල්ලීම වහාම අභියාචනාධිකරණය වෙත අධිකරණය විසින් ඉදිරිපත් කළ යුතු ය. තවද එය පිළිබඳව අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් ඒකපාක්ෂිකව සුදුස්සක් කරනු ලැබිය යුතු ය. ඉල්ලීම විභාග කිරීමෙන් පසු විනිශ්චයකාරවරයා විසින් අභියාචනයට ඉඩ දෙනු ලැබුවහොත් විනිශ්චයකාරවරයාට සුදුසුයැයි හැඟෙන කොන්දේසි මත හා කාලයක් ඇතුළත අභියාචන පෙත්සම භාර ගැනීමට නියම කෙරෙන ආඥාවක් ඔහු විසින් අධිකරණය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම.

833ආ. 833අ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද සෑම අභියාචන පෙත්සමක් සහ ගොනු කරන ලද සහ ඉදිරිපත් කරන ලද සියලු ලේඛන 1983 අංක 42 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන යටතේ මුද්දර ගාස්තුවෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

LXVIඅ වන පරිච්ඡේදය

ඉඩම්වලට බලපාන්නා වූ සාමය කඩවීමේ තර්ජනයක් එල්ල වී ඇති හෝ සාමය කඩවීමට ඉඩ ඇති ආරාවුල් පිළිබඳ විභාග කිරීමට අදාළ කාර්ය පටිපාටිය

ඉඩම්වලට බලපාන ආරාවුල් හොමු කිරීම.

833 ඇ. (1) ඉඩම්වලට බලපාන ආරාවුලක් නිසා සාමය කඩවීමේ තර්ජනයක් එල්ල වී ඇති හෝ සාමය කඩවීමට ඉඩ ඇති හෝ කවර විටක වුව ද —

(අ) ඒ ආරාවුල පිළිබඳව පරීක්ෂණයක් පවත්වන පොලිස් නිලධරයා විසින්—

(i) ඒ ඉඩම පිහිටියේ යම් ප්‍රාථමික අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ ප්‍රාථමික අධිකරණය වෙත ඒ ආරාවුල සම්බන්ධයෙන් ප්‍රකාශයක් හැකිතාක් අප්‍රමාදව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබූ දින සිට එක් සතියක් ඉකුත් වීමට පෙර දිනයක ඒ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියෙහි පෙනී සිටින ලෙසට වූ බැඳුම්කරයකට ඇතුළත් වන ලෙස ඒ ආරාවුලට සම්බන්ධ එක් එක් පාර්ශ්වකරුට නියම කිරීම හෝ එදින අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙසට ඒ එක් එක් පාර්ශ්වකරුට අවවාද කිරීම හෝ කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ii) සාමය ආරක්ෂා කිරීමෙහි ලා අවශ්‍ය වන්නේ නම්, ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් සිරභාරයට ගෙන, ඔවුන් සම්බන්ධයෙන් නීතිය අනුව ක්‍රියා කරනු ලැබීම පිණිස ඉඩම පිහිටා ඇත්තේ යම් මූලාය වන අධිකරණයක අධිකරණ බල සීමාව තුළ ද ඒ මූලායවන අධිකරණය වෙත ඔවුන් නොපමාව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ අවස්ථාවේදී ම ඒ ආරාවුල සම්බන්ධයෙන් ප්‍රකාශයක් ද ඒ අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය; නැතහොත්

(ආ) ඒ ආරාවුලට සම්බන්ධ යම් පාර්ශ්වකරුවකු විසින්, ඒ පිළිබඳ සිද්ධි සහ තමන් ඉල්ලා සිටින සහනය දක්වමින් සහ ආරාවුලට සම්බන්ධ අනෙක් පාර්ශ්වකරුවන්ගේ නම් සහ ලිපිනයන් වගඋත්තරකරුවන් විශයෙන් සඳහන් කරමින් දිවුරුම් පත්‍රයක් ඒ මූලායවන අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවිට ඒ අධිකරණය විසින් අනුගමනය කරන සාමාන්‍ය ක්‍රියාවලිය මගින් හෝ ලියාපදිංචි තැපැල් මගින් හෝ දැන්වීමක් යවමින්, ඒ දැන්වීමෙහි සඳහන් දිනයෙහි ඒ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස දැනුම් දෙනු ලැබිය යුතු අතර, තම හිමිකම් පෑම් සඳහන් කළ දිවුරුම් පත්‍ර සමග ඒ හිමිකම් පෑම් සඳහා තමන් විශ්වාසය තබන ලේඛන (හෝ ඒවායේ සහතික පිටපත්) අමුණා ඉදිරිපත් කරන ලෙස ද එසේ නම් කරනු ලැබූ පාර්ශ්වකරුවන්ට නියම කරනු ලැබිය යුතුය. තවද ඒ දිනය, දිවුරුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ දින සිට සති තුනක් නොඉක්මන දිනයක් විය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් හෝ දිවුරුම් පත්‍රයක් මූලායවන අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ආරාවුල,

විභාග කිරීමේ ද, ඒ පිළිබඳ තීරණයක් හෝ ආඥාවක් කිරීමේ ද අධිකරණ බලය ඒ චූලායචන අධිකරණයට තිබිය යුතු අතර, ඒ අධිකරණ බලය ඒ අධිකරණය වෙත මෙයින් සතු කරනු ලබන්නේ ය.

(3) පාර්ශ්වකරුවන් විසින් ස්වකීය හිමිකම් පෑම් සඳහන් කළ දිවුරුම් පත්‍ර සමග ඒ හිමිකම් පෑම් සඳහා තමන් විශ්වාසය තබන්නා වූ ලේඛන (හෝ ඒවායේ සහතික පිටපත්) අමුණා ඉදිරිපත් කරනු ලැබිය යුතු ලෙස විධාන කරමින් ඒ සඳහා දිනයක්, (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) අනුඡේදය යටතේ පාර්ශ්වකරුවන් ඉදිරිපත් කරනු ලැබූ දිනයේ දී හෝ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීම සඳහා ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදය යටතේ ඔවුන්ට නියම කර තිබූ දිනයේ දී හෝ අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය. ඒ දිනය එකී උපවගන්තිය යටතේ පාර්ශ්වකරුවන් එසේ ඉදිරිපත් කරනු ලැබූ දින සිට හෝ අධිකරණය ඉදිරියේ ඔවුන්ට පෙනී සිටීම සඳහා ඒ උපවගන්තිය යටතේ එසේ නියම කර තිබුණු දින සිට හෝ සති තුනක් නොඉක්මවන දිනයක් විය යුතු ය.

(4) ඉඩමට බලපාන ආරාවුලක් උද්ගත වී ඇති බව නිවේදනය කරන්නා වූ දැන්වීමෙහි සඳහන් දිනයේ දී අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට නියම කරන්නා වූ ද දැන්වීමක්, ආරාවුලට විෂය වස්තුව වන්නා වූ ඉඩමේ හෝ ඉඩමේ කොටසක හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක ඇලවීමට සැලැස්වීම, ඒ තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු එක් සතියක් ඉකුත්වීමට පෙර, අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය. ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන දිනය අධිකරණයේ දී ඊළඟට ඒ නඩුව කැඳවනු ලබන දිනය විය යුතු ය.

සම්බන්ධතාවක් දක්වන තැනැත්තා විසින්, අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට අතිරේකව, ස්වකීය හිමිකම් පෑම දක්වන්නා වූ දිවුරුම් පත්‍රයක් සමග තමා විශ්වාසය තබන යම් ලේඛන (හෝ ඒවායේ සහතික පිටපත්) අමුණා ඉදිරිපත් කරනු ලැබිය යුතු යයි ද මේ දැන්වීමෙන් නියම කරනු ලැබිය යුතුය.

(5) දිවුරුම් පත්‍ර හා ලේඛන ඉදිරිපත් කිරීම සඳහා නියම කරනු ලැබූ දිනයෙහි දිවුරුම් පත්‍ර සහ ලේඛන කිසිවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, යම් ලේඛන ඇතොත් ඒ සමග හරස් දිවුරුම් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා සති දෙකක් නොඉක්මවන කාලයක් දිවුරුම් පත්‍ර ඉදිරිපත් කළ පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම මත අධිකරණය විසින් ඒ පාර්ශ්වකරුවන්ට දෙනු ලැබිය යුතුය. හරස් දිවුරුම් පත්‍ර පිළියෙල කිරීම සඳහා නඩු වාර්තාව රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපිට දී කියවා බැලීමට ඒ පාර්ශ්වකරුවන්ට හෝ ඔවුන්ගේ නීතිඥවරයන්ට හෝ අධිකරණය විසින් අවසර දෙනු ලැබිය යුතුය.

(6) දිවුරුම් පත්‍ර සහ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා නියම කරනු ලද දිනයෙහි හරස් දිවුරුම් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීමක් කර නොමැති අවස්ථාවක හෝ හරස් දිවුරුම් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා නියම කරනු ලැබූ දිනයෙහි එවැනි දිවුරුම් පත්‍ර, හරස් දිවුරුම් පත්‍ර සහ ලේඛන ඉදිරිපත් කරනු ලැබ තිබුණ ද, නොතිබුණ ද—

(i) ආරාවුල සම්බන්ධයෙන් සමථයකට එළඹීමට පාර්ශ්වකරුවන් සහ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් (කිසිවකු වේ නොත්) ඒ තැනැත්තන් පෙළඹවීමට අධිකරණය විසින් සෑම ප්‍රයත්නයක් ම ගත යුතු ය. තව ද පාර්ශ්වකරුවන් සහ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් සමථයට එළඹීමට එකඟවන්නේ නම්, ඒ සමථයට එළඹීම වාර්තාගත කොට පාර්ශ්වකරුවන් සහ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් විසින් ඒ වාර්තාවට අත්සන් තැබිය යුතු අතර, සමථයට එළඹීමේ නියමවලට අනුව අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය ; හෝ

(ii) පාර්ශ්වකරුවන් සහ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් (කිසිවකු වේතොත්) ඒ තැනැත්තන් සමථයට නොඑළඹෙන අවස්ථාවක, ඉදිරිපත් කරන ලද ප්‍රකාශ සහ සපයන ලද දිවුරුම් පත්‍ර සහ ලේඛන මත අධිකරණය විසින් ආරාවුල විනිශ්චය කර, එම දින සිට එක් සතියක් ඇතුළත ඒ අනුව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

අතුරු ආඥාව.

833ඇ. මේ පරිච්ඡේදය යටතේ නඩු කටයුතු ආරම්භ කිරීමෙන් පසු යම් අවස්ථාවක, ඒ නඩු කටයුතු අවසන් වන තෙක් ක්‍රියාත්මක විය යුතු බවට මේ පරිච්ඡේදය යටතේ නියම කිරීමට තමාට බලය ඇති යම් ආඥාවක් ප්‍රකාර අතුරු ආඥාවක් චූලාය වන අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

ආඥාවල වලංගු භාවය.

833ඉ. (1) 833ඇ වගන්තියේ (6) වන උපවගන්තියේ (ii) වන අනුඡේදයේ සඳහන් කාලසීමාවෙන් පසුව කරන ලද ආඥාවන බලාත්මක භාවයක් හෝ වලංගු භාවයක් නොමැත්තේ ය. 833ඇ වගන්තියේ (6) වන උපවගන්තියේ (ii) වන අනුඡේදයේ සඳහන් කාලසීමාව ඇතුළත ආඥාවක් කිරීමට නොහැකි වූ චූලායවන අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් නියමිත කාලසීමාව ඇතුළත මේ ආඥාව කිරීමට නොහැකි වීම පිළිබඳව ලිඛිත වාර්තාවක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ආරාවුලක් සම්බන්ධයෙන් කරන ලද ආඥාවක් (1) වන උපවගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් බලාත්මක සහ වලංගු නොවන අවස්ථාවක, ඒ ආරාවුල සම්බන්ධයෙන් 833ඇ වගන්තිය යටතේ කරන ලද යම් අතුරු ආඥාවක් ද බලාත්මක සහ වලංගු නොවිය යුතු ය.

අලුත් නඩු කටයුත්තක් සඳහා බාධා ඇති බව.

833ඊ. යම් ආරාවුලක් සංයුක්ත වන සිද්ධීන් මත ම හෝ සාරානුකූල වශයෙන් එම සිද්ධීන් මත ම 833ඇ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කිසිම නඩු කටයුත්තක් පසුව පවරනු නොලැබිය යුතු ය.

නඩු කටයුතු නිසි අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පවරා ඇති අවස්ථාවක.

833උ. මේ පරිච්ඡේදය යටතේ වූ නඩු කටයුතුවල විෂය කාරණය වන ආරාවුලට ම අදාළ වන නඩු කටයුතු, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක හෝ යම් කිසි විනිශ්චයාධිකාරයක පවරනු ලැබ ඇත්තාවූ නැතහොත් පවරනු ලබන්නාවූ අවස්ථාවක, මේ පරිච්ඡේදය යටතේ පවරා ඇති නඩු කටයුතු අවසන් කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳව වැඩිදුර කිසිම ක්‍රියාවක් නොකළ යුතු ය.

ආරාවුල සන්තකය සම්බන්ධයෙන් වූ විටෙක, චූලායතන අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ තීරණය හා ආඥාව.

833ඉ. (1) ආරාවුල යම් ඉඩමක හෝ එහි කොටසක සන්තකය සම්බන්ධයෙන් වන අවස්ථාවක, 833ඇ වගන්තිය යටතේ ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබූ දිනයේ දී ඉඩමේ හෝ එහි කොටසක සන්තකය දැරුවේ කවර පාර්ශ්වයක් විසින් ද යන්න පිළිබඳව ඉදිරිපත් කර ඇති ප්‍රකාශය සහ සපයා ඇති දිවුරුම් පත්‍ර සහ ලේඛන අනුව තීරණය කිරීම සහ ඒ ඉඩමේ හෝ එහි කොටසේ සන්තකය සඳහා කවරකුට හිමිකම ඇත්තේ දැයි ආඥාවක් කිරීම පරීක්ෂණය පවත්වන චූලායතන අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

(2) යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක සන්තකයට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් වූ ආරාවුලක් පිළිබඳව පරීක්ෂණයක දී ඉදිරිපත් කොට ඇති ප්‍රකාශය සහ සපයා ඇති දිවුරුම් පත්‍ර හා ලේඛන අනුව 833ඇ වගන්තිය යටතේ ප්‍රකාශය හෝ දිවුරුම් පත්‍රය ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුවම වූ මාස දෙකක කාලය ඇතුළත, ඉඩමේ හෝ එහි කොටසෙහි සන්තකය දැරූ යම් තැනැත්තකු බලහත්කාරයෙන් සන්තකයෙන් බැහැර කරනු ලැබූ බවට චූලායතන අධිකරණයේ විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් ඒ බවට තීරණයක් කරනු ලැබිය හැකි අතර සන්තකයෙන් බැහැර කරනු ලැබූ පාර්ශ්වය එහි සන්තකයෙහි පුනස්ථාපනය කරන ලෙස විධාන කරමින් සහ නිසි අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක අධිකාරය යටතේ හැර එම සන්තකය සම්බන්ධයෙන් සියලු බාධා කිරීම් තහනම් කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උප වගන්තිය යටතේ වූ ආඥාවකින්, ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් ආකාරයෙන් එම ඉඩම හෝ එහි යම් කොටස සම්බන්ධයෙන් එහි නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුට හෝ තැනැත්තන් වැඩි දෙනකුට හිමිකම් ඇති බවට ප්‍රකාශ කළ යුතුය; තවද සිවිල් අධිකරණ බලය ඇති නිසි අධිකරණයක ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් යටතේ හෝ නිසි විනිශ්චයාධිකාරයක ආඥාවක් යටතේ හෝ ඒ තැනැත්තාට හෝ තැනැත්තන් ඉඩමෙන් හෝ එහි යම් කොටසකින් නෙරපනු ලබන තෙක් සහ ඒ ආඥාවේ හෝ තීන්දු ප්‍රකාශයේ අධිකාරය යටතේ හැර ඒ සන්තකය සම්බන්ධයෙන් සියලු බාධා කිරීම් තහනම් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශයට සහ තහනමට අතිරේකව (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක එම ආඥාවෙහි සඳහන් යම් පාර්ශ්වයක් ඒ ආඥාවේ සඳහන් ඉඩමේ හෝ යම් කොටසක සන්තකය පුනස්ථාපනය කළ යුතු බවට විධානයක් ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(5) අවස්ථාගත කරුණු අනුව තත් කාර්යය කිරීම යුක්ති සගගත වන අවස්ථාවක, අධිකරණය විසින්—

(i) සන්තකයෙහි තබන ලද පාර්ශ්වකරු නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් ඒ සන්තකය ලැබීමට හිමිකම නොතිබූ බවට තීරණය කරනු ලැබුවහොත් සන්තකය අහිමිවීමේ ප්‍රතිඵලය වශයෙන්, අවස්ථෝචිත පරිදි, අනෙක් පාර්ශ්වය හෝ පාර්ශ්වකරු වන්ට විඳීමට සිදුවිය හැකි අලාභවලට ප්‍රතිපක්ෂව උචිත මුදලක ඇපයක් සපයන ලෙස සන්තකයෙහි තබනු ලැබූ පාර්ශ්වයට විධාන කරමින් ; හෝ

(ii) ඒ ඉඩමෙන් හෝ එහි කොටසින් උද්ගත වන ලාභ සහ ආදායම සඳහා අධිකරණය කට උත්තර දිය යුතු ස්වාධීන භාරගැනුම් කරුවකු ඒ ඉඩම හෝ එහි කොටස පිළිබඳ සන්තකයෙහි තබමින්

ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(6) ඉඩමේ හෝ එහි කොටසක සන්තකය ස්වාධීන භාරගැනුම්කරුවකු වෙත භාර දෙමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලබන අවස්ථාවක, සන්තකය සම්බන්ධයෙන් නිසි අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් ආඥාවක් කරනු ලබන තෙක් ඒ භාර ගැනුම් කරු සන්තකයෙහි රඳවා ගත යුතු ය.

(7) ඒ ඉඩමේ හෝ එහි කොටසෙහි සන්තකය ස්වාධීන භාරගැනුම්කරුවකුට භාරදෙමින් (5) වන උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ ආඥාවක් අධිකරණය විසින් කරනු ලබන අවස් ථාවක, ඒ ඉඩමේ හෝ එහි කොටසෙහි නිසි කළමනා කරණය සහ ආරක්ෂණය සහතික කිරීමෙහිලා සහ එහි ආදායම සම්බන්ධයෙන් ගිණුම් තැබීම සඳහා ඒ භාරගැනුම්කරු මත සුදුසුයයි පෙනී යන කොන්දේසි අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය.

ආරාවුල වෙනත් යම් අයිතිවාසිකමක් සම්බන්ධයෙන් වන විට, විනිශ්චයකාරවරයාගේ තීරණය හා ආඥාව.

833එ. (1) ආරාවුල, යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක හෝ සන්තකයට ඇති අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූවක් නොවන, ඒ ඉඩමේ හෝ එහි කොටසක හෝ යම් අයිතිවාසිකමකට සම්බන්ධ වූවක් වන අවස්ථාවක, ආරාවුලෙහි විෂය කරුණ වූ අයිතිවාසිකමට හිමිකම ඇත්තේ කවර පාර්ශ්වයට ද යන්න ඉදිරිපත් කර ඇති ප්‍රකාශය හෝ සපයා ඇති දිවුරුම් පත්‍රය හෝ ලේඛනය අනුව ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් තීරණය කර (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) මේ උපවගන්තිය යටතේ වූ ආඥාවක සඳහන් යම් තැනැත්තකුට ඒ ආඥාවේ දක්වා ඇති ඉවමට හෝ ඉඩමේ යම් කොටසකට නැතහොත් ඉඩම හෝ ඉඩමේ යම් කොටසක් සම්බන්ධයෙන් ඇත්තා වූ යම් අයිතිවාසිකමක්, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රකාර අහිමි කරනු ලබනතුරු, ඒ තැනැත්තාට ඒ අයිතිවාසිකමට හිමිකම තිබිය යුතු යයි ඒ ආඥාවෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර, ඒ පාර්ශ්වකරු විසින් ඒ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඉහත කී අන්දමේ ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක හෝ අධිකාරය යටතේ හැර, අන්‍යාකාරයකින් ඇති විය හැකි සියලු බාධා හෝ මැදිහත්වීම ද තහනම් කරනු ලැබිය හැකි ය.

යම් අයිතිවාසිකමක් සන්තකය සඳහා හෝ එය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඇප ආඥා කළ හැකි බව.

833ඒ. ඉඩමේ හෝ එහි කොටසක හෝ සන්තකයේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඒ ඉඩමෙහි යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇප තැබීම සම්බන්ධයෙන් හෝ ඒ ඉඩමේ යම් භෝගයක් නැතහොත් පලදාවක් විකිණීම සම්බන්ධයෙන් හෝ ඒ ඉඩමට ඇති යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කළ යුතු ආකාරය සම්බන්ධයෙන් හෝ යම් භෝගයක් හෝ පලදාවක් විකිණීමෙන් ලැබෙන මුදල්වල භාරකාරත්වය හෝ ඒ මුදල් බැහැර කිරීම සම්බන්ධයෙන් හෝ සුදුසු යයි ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් කල්පනා කරනු ලබන වෙනත් යම් විධාන ද මේ පරිච්ඡේදය යටතේ කරනු ලබන ආඥාවක ඇතුළත් විය හැකි ය.

පාර්ශ්ව කරුවන් කිසිවකු පෙනී නොසිටින අවස්ථාවක කළ යුතු ආඥාව.

833ඔ. ආරාවුලෙහි පාර්ශ්වකරුවන් අධිකරණය ඉදිරියෙහි පෙනී නොසිටින අවස්ථාවක හෝ පෙනී සිට හෝ ඉදිරිපත් කරනු ලැබූ නමුත් ලේඛන සහිතව හෝ රහිතව යම් දිවුරුම් පත්‍රයක් ඉදිරිපත් නොකරන අවස්ථාවක අධිකරණය විසින්—

(අ) සන්තකය සම්බන්ධයෙන් වූ ආරාවුලක් පිළිබඳ නඩුවක දී නම්, එවකට සන්තකය දරන පාර්ශ්වකරුට සන්තකය තව දුරටත් තබා ගැනීමට අවසර දෙමින් ආඥාවක් කළ යුතු ය ; තවද

(ආ) වෙනත් යම් අයිතිවාසිකමක් සම්බන්ධයෙන් වූ ආරාවුලක් පිළිබඳ නඩුවක දී නම්, ඒ අයිතිවාසිකම සම්බන්ධයෙන් එවකට පවත්නා තත්ත්වය තවදුරටත් පවත්වා ගෙන යාමට අවසර දෙමින් ආඥාවක් කළ යුතු ය.

විනිශ්චය කාරවරයා විසින් ක්‍රියා කළ හැක්කේ කවර කරුණු මත ද යන වග.

833ඖ. පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශනය සහ සපයන ලැබූ දිවුරුම්පත්‍ර හා ලේඛන පමණක් මේ පරිච්ඡේදය යටතේ තීරණයක් හා ආඥාවක් කිරීමේ දී, මූලායවන අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය. මේ පරිච්ඡේදය යටතේ කිසිම විභාගයක දී හෝ පරීක්ෂණයක දී වාචික සාක්ෂි ඉදිරිපත් කිරීමට කිසිම පාර්ශ්වකරුවකුට අවසර දෙනු නොලැබිය යුතු ය.

ආඥාවක් කඩ කිරීම හෝ ආඥාවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම හෝ සම්බන්ධයෙන් දණ්ඩනය.

833ක. මේ පරිච්ඡේදය යටතේ කරන ලද ආඥාවක් කඩ කරමින් ක්‍රියා කරන හෝ ඒ ආඥාව අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මූලායවන අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් වරදකරු කරනු ලැබීමේ දී මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

නිසි අධිකරණයකදී හෝ විනිශ්චයාධිකාරයකදී ඔප්පු කරනු ලබන අයිතිවාසිකමකට හෝ සම්බන්ධතාවකට ආඥාව බල නොපෑ යුතු බව.

833ග. (1) නිසි අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් ඉදිරියේ දී යම් තැනැත්තකු විසින් යම් ඉඩමකට හෝ ඉඩමක යම් කොටසකට හෝ ඇති යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ඔප්පු කරනු ලැබ ඇති විටෙක, ඒ අයිතිවාසිකමට හෝ සම්බන්ධතාවට බලපෑමක් නැතහොත් හානියක් මේ පරිච්ඡේදය යටතේ වූ ආඥාවකින් සිදු නොවිය

යුතු ය ; තව ද ආරාවුලට සම්බන්ධ තැනැත්තන්ට මේ වගන්තිවල බලපෑම පැහැදිලි කරදීම ද එසේ ම මේ පරිච්ඡේදය යටතේ ආඥාවක් කිරීමෙන් පසු මේ වගන්තිවල බලපෑම පැහැදිලි කෙරෙන දැන්වීමක් ආරාවුලට විෂයය වූ ඉඩමේ හෝ වෙනත් යම් උචිත පොදු ස්ථානයක හෝ ඇලවීමට කටයුතු සැලැස්වීම ද මේ පරිච්ඡේදය යටතේ විභාගයක් ආරම්භ කරන මූලායතන අධිකරණයේ විනිශ්චය කාරවරයාගේ කාර්යය විය යුතු ය.

(2) මේ පරිච්ඡේදය යටතේ කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

" ඉඩම්වලට බලපාන ආරාවුල " යන්නෙහි අර්ථය.

833ඩ. මේ පරිච්ඡේදයෙහි " ඉඩම්වලට බලපාන ආරාවුල " යන්නට, යම් ඉඩමක හෝ ඉඩමක කොටසක හෝ සන්තකයට ඇති අයිතිවාසිකම පිළිබඳව වූ සහ එහි පිහිටි ගොඩනැගිලිවල සන්තකය පිළිබඳව වූ හෝ, ඒ ඉඩමේ නැතහොත් ඉඩම් කොටසේ මායිම් පිළිබඳව වූ හෝ, යම් ඉඩමක් හෝ ඉඩමක කොටසක් හෝ වගා කිරීමේ අයිතිවාසිකම පිළිබඳව වූ හෝ, යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක බෝග වලට හෝ පලදාවට ඇති අයිතිවාසිකම පිළිබඳව වූ හෝ, ඉඩමට බලපාන පරවශතාවක ස්වභාවයේ යම් අයිතිවාසිකමක් පිළිබඳව වූ හෝ, යම් ආරාවුලක් ඇතුළත් වන අතර මේ පරිච්ඡේදයෙහි " ඉඩම " පිළිබඳ යම් සඳහන් කිරීමකට ඒ ඉඩම මත පිහිටි යම් ගොඩනැගිල්ලක් පිළිබඳ සඳහන් කිරීමක් ද ඇතුළත් වේ.

පිස්කල් විසින් අධිකරණයේ ආඥා ක්‍රියාවේ යෙදවිය යුතු බව.

833ජ. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ කරනු ලබන සියලු ආඥා, අධිකරණයේ පිස්කල්වරයා විසින් අවශ්‍ය වූ විටෙක ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

53. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උප ලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) අංක 135 දරන ආකෘතියෙහි " ප්‍රධාන ලිපිකරු " යන වචන වෙනුවට " රෙජිස්ට්‍රාර්වරයා " යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) අංක 136 දරන ආකෘතිය වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන් :—

"අංක 136 (824 වන වගන්තිය)

**මූලාසවන අධිකරණයේ සාක්ෂිකරුට යවන් සිතාසිය.**

පැමිණිලිකරු

අංකය : එදිරිව

විත්තිකරු.

........................ වෙත ය.

ඉහත සඳහන් නඩුව සම්බන්ධයෙන් සාක්ෂි දීමට (සහ පහත දැක්වෙන ලේඛන එනම්........................ ගෙන ඒමට) ලබන ............ වන දින පෙරවරු ............ ට මේ අධිකරණය ඉදිරිපිට පෙනී සිටින ලෙස ඔබට නියම කරනු ලැබේ.

රෙජිස්ට්‍රාර්වරයා.

19.........මස............ වන දින දීය."

**54.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන අලුත් කොටස එකතු කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

"IV වන කොටස (833 වන වගන්තිය)

**මූලාසවන අධිකරණය**

මූලාසවන අධිකරණවල දී ලේඛනගත නීතිඥවර යන්ට මෙන්ම, පාර්ශ්වකරුවකු සහ පාර්ශ්වකරු වකු අතර හෝ ලේඛනගත නීතිඥවරයා සහ සේවා දායක අතර ගෙවිය යුතු ගාස්තු සහ අයකිරීම් පරිමාණය මේ උපලේඛනයේ I වන සහ II වන කොටස්වල සඳහන් දිසා අධිකරණවලට අදාළ පරිමාණයම විය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.